වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

2025

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

இலங்கை சட்ட உதவி ஆணைக்குழு

Legal Aid Commission of Sri Lanka

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

இலங்கை சட்ட உதவி ஆணைக்குழு

The Legal Aid Commission of Sri Lanka

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය මගින් නීති ආධාර ලබා ගැනීම මූලික අයිතිවාසිකමක් ලෙස හඳුන්වා දී නැතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** හා **13(3)** ව්‍යවස්ථාව මඟින් ඒ පිළිබඳව අවධානයට පාත්‍ර කොට ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** ව්‍යවස්ථාව - නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **13(3)** ව්‍යවස්ථාව - වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයෙකු මඟින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය.

- තව ද 1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44 රීතිය මඟින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් තහවුරු කිරීමක් සිදු කර ඇත.

- අපරාධ නඩු විධාන සංග්‍රහයේ 260 වගන්තියත් 195 වගන්තියත් 353 වන වගන්තියත් මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් ප්‍රතිපාදන සලස්වා ඇත.

- 2007 අංක 56 දරණ අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 4 වන වගන්තිය මගින් අපරාධ නඩු වකදී නීති ආධාර ලබා ගැනීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට ඇති අයිතිවාසිකම් දක්වා ඇත.

- එසේම එකී පනතේ 5 වන වගන්තිය මගින් වැඩිදුරටත් ප්‍රකාශ කොට ඇත්තේ ළමයෙකු අපරාධ නඩුවකට සම්බන්ධ වී ඇති අවස්ථාවක ඔහුට එරෙහිව හෝ ඔහු වෙනුවෙන් රජය මගින් නීති ආධාර සැලසිය යුතු බවයි.

සභාපතිතුමාගේ පණිවිඩය



2025 වසර තුළ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යභාරය සඳහා රජයේ ප්‍රතිපාදන පුනරාවර්ථන වියදම් සඳහා රු.මිලියන 369.20 සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 5.2 ලබාදුණි. මෙම ප්‍රතිපාදන ඉතා ප්‍රශස්ථ ලෙස යොදාගනිමින් සහ කලමනාකරණය කරමින් පැවති මෙම කාර්ය මණ්ඩලය ද සමඟ ඉතා ඉහල නීති ආධාර සේවාවක් ශ්‍රී ලාංකික මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

ඒ අනුව 2025 වසර තුළ නඩු 12654 ක් අළුතින් ගොනු කළ අතර නීති උපදේශන සේවා 128808 ක් පමණ පවත්වන ලදී. නඩු 14027 ක් පමණ අවසන් කල අතර වර්ෂ අවසාන වන විට නඩු 24969 පමණ අධිකරණයේ පැවතිණි. **“නීතිය නොදැන සිටීම සමාවට කරුණක් නොවේ”** යන තේමාව මත පිහිටා ආන්තික ප්‍රජාව නීතිමය දැනුමෙන් පෝෂිත කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 347 ක් පමණ පවත්වන ලදී. මෙම වසර තුළ පමණක් නීති ආධාර සේවාලාභීන් සඳහා රු. 335,885,644.35 පමණ වන්දි වශයෙන් ලබා දීමට අවශ්‍ය අධිකරණයේ මැදිහත් වීම සිදු කරන ලදී.

පසු ගිය කාලයේ ලබාදුන් සේවාවන් මෙන් ම උගත් පාඩම් කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ද සහයෝගය ඇතිව පුළුල් පරාසයකින් නීති ආධාර සේවාවක් මහජනතාවට වඩාත් සමීප කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික සැලසුම් මත තිරසාර සංවර්ධන ඉලක්කයන්ට අනුගතව කටයුතු කිරීමට පියවර ගන්නා ලදී. මෙම වසරේ දී ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සමාලෝචනය කර සකස් කිරීමට පියවර ගත් අතර කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය මානව සම්පත් කළමනාකරණය මඟින් ආයතනයේ දැක්ම හා මෙහෙවර ඉලක්ක කර කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව මෙම වසර තුළ කොමිෂන් සභා රැස්වීම් වාර 13 ක් පවත්වා ඇති අතර එමඟින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පරිපාලනමය තීරණ ගැනීම මෙන් ම ප්‍රතිපත්ති සම්පාදනයට ද පියවර ගන්නා ලදී. මෙම වසර තුළ ආයතනය අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් දැඩි අවධානයකින් කටයුතු කල අතර විගණන තොරතුරු සහ පිලිතුරු නිසි පරිදි සැපයීමට මෙන් ම ඒවාට අනුගත වෙමින් ආයතනික වෙනස්කම් සිදුකිරීමට පියවර ගන්නා ලදී. අභ්‍යන්තර විගණන සහ කළමනාකරණ කමිටු පැවැත්වීමට ද පියවර ගන්නා ලදී. ඒ අනුව සමස්ථයක් වශයෙන් ආයතනයේ කාර්යභාරය සියලු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට 2025 වසර තුළ හැකි විය.

ජනාධිපති නීතිඥ වී. පුවිදරන් මහතා

අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය



ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2025 වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකි වීම සුවිශේෂී වේ. 1978 අංක 27 දරණ ජාතික නීති ආධාර පනත මගින් මෙම කොමිෂන් සභාව පිහිටුවා වසර 47ක ගමන් මගක් පසුකරමින් සිටින මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව මඟින් 2025 වසර තුළ ආන්තික ප්‍රජාවට යුක්තියට ප්‍රවේශ වීම පහසු කරනු වස් අප විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ දියත් කරනලද වැඩසටහන් ඇතුලත් සේවාවන් පිළිබඳ විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

2025 වසර තුළ කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර හා අරමුණුවලට අනුගතව සකස් කරනලද ක්‍රියාකාරී සැළසුමට අනුව ආර්ථික පසුබැසීම් සහිත පුද්ගලයින්ට, කාන්තාවන්ට, දරුවන්ට, වැඩිහිටියන්ට සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට නීති ආධාර සේවාවන් පුළුල් කිරීමට අප කටයුතු කළෙමු.

ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන අපගේ මධ්‍යස්ථාන හරහා සිවිල්, අපරාධ, පවුල් නීති, කම්කරු, ඉඩම්, සහ පරිපාලන නීති සම්බන්ධයෙන් දහස් ගණනක් පුරවැසියන්ට නොමිලේ නීති උපදෙස් සහ අධිකරණයේ නඩු සඳහා නීතීඥ නියෝජනය ලබා දී ඇත. මෙම වසරේදී, නීති සාක්ෂරතාව වැඩිදියුණු කිරීම අපගේ ප්‍රමුඛ අරමුණක් විය. ග්‍රාමීය ප්‍රදේශවල නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන්, පාසල් හා අනෙකුත් ආයතන මට්ටමේ දැනුවත් කිරීමේ වැඩමුළු, සහ විශේෂයෙන් කාන්තා හා දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වැඩමුළු මගින් පුළුල් ජනතාවක් ආවරණය කළෙමු.

එමෙන්ම, 2025 වසර තුළ අප ආයතනික ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළෙමු. ඩිජිටල් දත්ත කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, මධ්‍යස්ථාන කටයුතු අධීක්ෂණ ක්‍රමවේද පුළුල් කිරීම, සහ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ඒ අතරින් වැදගත් වේ. නීති නිලධාරීන් සහ සහායක කාර්යමණ්ඩලය සඳහා කාර්ය සාධන මූලධර්ම සහ පාර්ශ්වික ඇගයීම් ක්‍රමවේද හඳුන්වා දීම මඟින් සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අපට හැකි විය.

අපගේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, ඇතුළු අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීප සහයෝගිතාවයකින් කටයුතු කළෙමු. විශේෂයෙන් තිරසාර සංවර්ධන අරමුණු (SDGs), විශේෂයෙන් SDG 16 – “සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන” ඉටුකර ගැනීමට අපගේ දායකත්වය තවදුරටත් වර්ධනය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය සකස් කරමින් එය පාර්ශවකරුවන්ගේ සමාලෝචනයට ඉදිරිපත් කිරීමට හැකි වීම අප ආයතනයක් ලෙස සිදුකළ තීරණාත්මක කාර්යභාරයකි.

අභියෝග රහිත වසරක් නොවූ බව ද සඳහන් කළ යුතුය. සීමිත මූල්‍ය හා මානව සම්පත්, නීත ආධාර සේවා කෙරෙහි වැඩිවන ඉල්ලුම, සහ දුරස්ථ ප්‍රදේශවල සේවා සැපයීමේ දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, අපගේ කැපවූ කාර්ය මණ්ඩලය සහ භාහිර සහ ස්වේච්ඡා නීතිඥ ජාලය සමඟ එක්ව මෙම අභියෝග සාර්ථකව ජයගත් බව ගෞරවයෙන් සඳහන් කරමි.ඉදිරියට ද, අප ජයගත යුතු අභියෝග ලෙස අපගේ ප්‍රමුඛතා අතරට නීති ආධාර සේවාවන් ඩිජිටල්කරණය, සේවාවන් ව්‍යාප්ත කිරීම, ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම සහ ක්‍රමවේදයන් මත ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් නීති ආධාර සේවාවන් හැඩගැස්වීම, සහ විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම් සඳහා විශේෂ නීති ආධාර ඒකක පිහිටුවීම, අපරාධ නීති ආධාර සේවාවන් පුළුල් කිරීම ආදිය ඇතුළත් වේ. මෙම වැඩපිළිවෙල මඟින් නීතිය සෑම පුරවැසියෙකුටම සමීප කිරීම අපගේ ඒකායන අරමුණ වේ.

අවසාන වශයෙන්, කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ කොමසාරිස් මණ්ඩලය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට, සහයෝගිතා ආයතනවලට, නීතිඥ මහත්ම මහත්මීන්ට, සහ විශේෂයෙන්ම තවත් සාර්ථක වසරකින් ඉදිරියට පියවර තැබීමට කැපවූ කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි. “යුක්තිය සමානව සැමට” යන අපගේ අධිෂ්ඨානය සමඟ, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කරමින්, සාධාරණ හා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අප කැපවී සිටිමු.

රුක්මන් ගමගේ,

අධ්‍යක්ෂ ජනරාල්

පටුන

01. 1978 අංක 27 දරණ නීති ආඥාර පනතින් සංස්ථාපිත
ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාව
02. 1978 අංක 27 දරණ නීති ආඥාර පනතේ අරමුණු
03. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාවේ සංවිධාන සැලැස්ම
04. 2025.12.31 දිනට නීති ආඥාර කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය
05. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සංයුතිය
06. නීති ආඥාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම
07. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය
08. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ආවරණය කරන අධිකරණ
09. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාවේ ආයතනික සංයුතිය
10. නීති අංශය
11. පරිපාලන අංශය
12. මූල්‍ය අංශය
13. විගණන වාර්තාව
14. ශ්‍රී ලංකා නීති ආඥාර කොමිෂන් සභාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දුරකථන නාමාවලිය

1978 අංක 27 දරණ නීති ආධාර පනතින් සංස්ථාපිත

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

1978 අංක 27 දරණ නීති ආධාර පනතේ ඉතාම වැදගත් සාධනීය ලක්ෂණය වූයේ නීති ආධාර වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම උදෙසා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම තුළින් රට තුළ ක්‍රියාත්මක කල යුතු නීති ආධාර ලබා දීමේ ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කරලීමයි.

උක්ත අරමුණු වෙනුවෙන් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව පිහිටු වීම හා ක්‍රියාකාරිත්වය සැකසීම මෙම පනතේ ප්‍රධානම කර්තව්‍යයි.

දැක්ම :-

ශ්‍රී ලාංකිකයින් සියලු දෙනාටම සාධාරණත්වය ඉටු කිරීමට හැකි වන සේ යුක්තිය කරා පහසු ප්‍රවේශයක් ලබා දීමට කටයුතු කිරීම.

මෙහෙවර :-


දරිද්‍රතාවය නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනීමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීමත්, අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය ලබා දීමත්, සමස්ථ සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීමත්, නව නීති සම්පාදනයේ දී හා නෛතික නීති ප්‍රතිසංස්කරණ වල දී රජයට උපදේශණ කාර්යයේ නිරත වීමත්, ආදී කාර්යයන් හරහා ජනසමාජය යුක්තිය කරා පහසු ප්‍රවේශයකට නිරත කරවීමයි.

1978 අංක 27 දරණ නීති ආඥාර පනතේ අරමුණු

1978 අංක 27 දරණ පනතේ 3 හා 4 වන වගන්තිය.

1. ඕනෑම ආර්ථික මට්ටමක සිටින සහය ලැබිය යුතු ඕනෑම තැනැත්තෙකුට නීති උපදේශනය ලබා දීම.
2. අඩු ආදායම්ලාභී පුද්ගලයින්ගේ අධිකරණයේ පවතින නඩු කටයුතු වෙනුවෙන් නීතිඥවරයින්ගේ සේවය ලබා දීම.
3. හැකි තරම් තැනැත්තන් සංඛ්‍යාවකට නීති ආධාර ලබා ගැනීමට සැලැස්වීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය යැයි සලකන යම් ප්‍රමාණයක් වෙනුවෙන් ප්‍රාදේශීය කාර්යාල පිහිටු වීම.
4. නීති ආධාර දීමට හැකි වන්නේ කුමන කාරණා හෝ කාරණා වර්ග සම්බන්ධයෙන් ද ඒ කාරණා හෝ ඒ කාරණා වර්ග නිශ්චය කිරීම.
5. නඩු කටයුතු තීරණය කරනු ලැබූ හෝ සමථයට පත් කරනු ලැබූ හෝ අවස්ථාවක දී තිබෙන අරමුදල් පිළිබඳව සැලකිලිමත් වෙමින් සහ සියලුම අදාළ නිර්දේශ සැලකිල්ලට භාජනය කරමින් සහය ලැබූ තැනැත්තන් විසින් ගාස්තු හා වියදම් ගෙවීම සම්බන්ධයෙන් පිළිපැදිය යුතු දල ක්‍රියාමාර්ග නිශ්චය කිරීම.
6. ආණ්ඩුව හා පළාත් පාලන ආයතන ද අධ්‍යාපනික ආයතන හා නීති ආධාර සැපයීමේ යම් අංශයක් කෙරෙහි සම්බන්ධතාවක් ඇත්තා වූ ප්‍රජා අසල්වැසි ව්‍යාත්තීය සාමාජීය හා වෙනත් කණ්ඩායම් ද විමසීම මඟින් නීති ආධාර යෝජනා ක්‍රමය පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
7. නීති ආධාර සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම, ඒවාට මුදල් සැපයීම හා ඒවා අධීක්ෂණය කිරීම.
8. අවබෝධය ඇති කිරීමේ අභිප්‍රාය ඇතිව
    i. නීති ආධාර යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය පිළිබඳව හා එය පවත්වාගෙන යාමේ දී හා එයට සහභාගීවීමේ දී ස්වකීය වගකීම් හා යුතුකම් ද කාර්ය භාර්ය ද පිළිබඳව නීති ව්‍යාත්තියේ සාමාජිකයන් දැනුවත් කිරීම.
    ii. ශ්‍රී ලංකාවේ පවත්නා නීති යටතේ ස්වකීය අයිතිවාසිකම් බලතල වරප්‍රසාද හා කාර්ය සම්බන්ධයෙන් විශේෂ අවශ්‍යතාවන් ඇති මහජනතාව ද පොදුවේ සමස්ථ ප්‍රජාව ද අරඹයා අධ්‍යාපනික වැඩසටහන් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම.
9. නීති ආධාර සැපයීමෙහි ලා වූ සුවිශේෂී අංශයක් හෝ අංශ සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන් ගැටළු මධ්‍යස්ථාන සහ/හෝ ව්‍යාපෘති පිහිටුවීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය කාර්ය මණ්ඩලය සේවයෙහි නියුක්ත කිරීම.
10. අලුත් වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මහජනයාගේ යෝජනා ලබා ගැනීම හා ඒ සම්බන්ධයෙන් ඔවුන් දිරිගැන්වීම.
11. නීති ආධාර ලබා දෙන්නා වූ තැනැත්තන්ගේ අධ්‍යාපනය හා ඔවුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනික ආයතන හා මණ්ඩල සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
12. නීති ආධාර ලබා ගැනීමේ හැකියාව පිළිබඳව මහජනයාට තොරතුරු සැපයීම.
13. ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල නීති ප්‍රතිසංස්කරණ නියෝජිත ආයතන වලට හා රජයට කරුණු ඉදිරිපත් කිරීම.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - සංවිධාන සැලැස්ම



2025.12.31 දිනට නීති ආධාර කොමිෂන් සභාවේ
කාර්ය මණ්ඩලය

සේවක කාණ්ඩ මට්ටම	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	අධ්‍යක්ෂ ජෙනරාල්	01	-
	අධ්‍යක්ෂක (නීති)	01	-
	අධ්‍යක්ෂක (පරිපාලන හා මූල්‍ය)	01	-
	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂක (නීති)	03	03
	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂක (ප්‍රාදේශීය)	09	08
	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන)	01	01
	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂක (මූල්‍ය)	01	01
	නීති නිලධාරීන්	135	108
තෘතීය මට්ටම	ගිණුම් නිලධාරී	01	01
	පරිපාලන නිලධාරී	01	01
	සභාපතිතුමාගේ පුද්ගලික සහකාර	01	01
ද්විතීය මට්ටම	කළමණාකරණ සහකාර (තාක්ෂණ)	04	03
	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	115	83
ප්‍රාථමික මට්ටම	රියදුරු	06	02
	කාර්යාල කාර්ය සහයක	80	58
එකතුව		**360**	**270**

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ සංයුතිය

කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින්
(09)

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්
(03)

නීතිඥ සංගමය විසින් පත් කරනු ලබන සාමාජිකයින්
(06)


ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභා සාමාජිකයින් වර්ෂ - 2025




ජනාධිපති නීතිඥ වී. පුවිතරන්
මහතා



ජනාධිපති නීතිඥ නෙවිල්
අබේරත්න **මහතා**




ජනාධිපති නීතිඥ චන්ද්‍රා
ජයසේකර **මහතා**



ජනාධිපති නීතිඥ චන්දන
ලියනපටබැඳි **මහතා**



නීතිඥ සංජය ගමගේ
මහතා



නීතිඥ බිනර ගුණසේකර
මහතා



නීතිඥ අමල් රන්දෙණිය
මහතා



නීතිඥ සනත් විජේවර්ධන
මහතා



නීතිඥ තුෂානි මවාඩෝ
මහත්මිය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් ද, ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නම්කරනු ලබන සාමාජිකයින් හය දෙනෙකුගෙන් ද සමන්විත වන අතර ඒ සෑම සාමාජිකයෙකුම තුන් අවුරුදු කාලසීමාවක් සඳහා පත් කරනවා ඇත. සාමාජිකයෙකුගේ සේවා කාලය වූ වසර තුනක කාලය අවසන් වීමෙන් පසු වුවද නැවත සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමේ හැකියාව ඇත. එසේම ගරු අග්‍රවිනිශ්චකාරතුමාගේ සභාපතීත්වයෙන් යුත් නීති ආධාර උපදේශක මණ්ඩලයකින් කොමිෂන් සභාවේ කටයුතු අධීක්ෂණය කිරීමට අදාළ ප්‍රතිපාදන නීති ආධාර පනත මඟින් දක්වා ඇත. එම උපදේශක මණ්ඩලය සාමාජිකයින් 30 ගෙන් සමන්විත විය යුතුය. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සාමාජිකයින් 09 ත්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුත්, ගරු අග්‍රවිනිශ්චකාර විසින් නම් කරනු ලබන අධිකරණ නියෝජනය කිරීම සඳහා සාමාජිකයින් 06කුත්, අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ආණ්ඩුව, පළාත් පාළන ආයතන, අධ්‍යාපනික ආයතන හා නීති ආධාර සැපයීමේ අංශ කෙරෙහි සම්බන්ධතාවයක් ඇත්තාවූ ප්‍රජා, අසල්වැසි, ව්‍යාත්තීය, සාමාජීය හා වෙනත් කණ්ඩායම් නියෝජනය කිරීමට නම් කරන සාමාජිකයින් 12 ත් ඇතුලත්ව මෙම උපදේශක මණ්ඩලය සමන්විත විය යුතු බවට ප්‍රතිපාදන දක්වා ඇත.


<u>නීති ආධාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම</u>

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවට 2025 වර්ෂය වන විට වසර හතලිස්හතක් සපිරේ. මෙම වසර හතලිස්හතක කාලය තුළ කොමිෂන් සභාවේ අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ ලා කොළඹට සීමා නොවී කොළඹ කේන්ද්‍ර කර ගත් ප්‍රාදේශීය කාර්යාල 87 ක ජාලයක් මඟින් ස්වකීය කාර්යභාරය ක්‍රියාත්මක කිරීමට යෙදිනි. මෙම සමස්ථ කාලය තුළ (1978 - 2025) ප්‍රාදේශීය කාර්යාල වල ආරම්භය පහත පරිදි වේ.

වර්ෂය	වර්ෂය තුළ ආරම්භ කරන ලද ප්‍රාදේශීය මධ්‍යස්ථාන ගණන	සම්පූර්ණ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ගණන
1978	1	1
1994	3	4
1996	1	5
2003	5	10
2005	2	12
2006	19	31
2007	9	40
2008	6	46
2009	8	54
2010	6	60
2011	7	67
2012	7	74
2013	2	76
2014	0	76
2015	0	76
2016	2	78
2017	4	82
2018	1	83
2019	1	84
2020	-	84
2021	-	84
2022	1	85
2023	-	85
2024	1	86
2025	1	87

2025.12.31 දිනට සමස්ථ ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව 87 කි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභා මධ්‍යස්ථාන ව්‍යාප්තිය
(සිතියම හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන)



1	මූලස්ථානය	44	කුරුණෑගල
2	අක්කරේපත්තු	45	මහියංගණය
3	අම්පාර	46	මහව
4	අනුරාධපුරය	47	මන්නාරම
5	අත්තනගල්ල	48	මාරවිල
6	අවිස්සාවේල්ල	49	මාතලේ
7	බද්දේගම	50	මාතර
8	බදුල්ල	51	මතුගම
9	බලංගොඩ	52	මාවනැල්ල
10	බලපිටිය	53	මිනුවන්ගොඩ
11	බන්ඩාරවෙල	54	මොණරාගල
12	බත්තරමුල්ල	55	මුලතිව්
13	බොරැල්ල	56	මල්ලාහම්
14	මඩකලපුව	57	මුත්තූර්
15	වාවකච්චේරි	58	නාවලපිටිය
16	හලාවත	59	නීගමුව
17	දඹුල්ල	60	නිකවැරටිය
18	දෙයියන්දර	61	නුගේගොඩ
19	දෙනියාය	62	නුවරඑළිය
20	දෙහිඅත්තකණ්ඩිය	63	පානදුර
21	ඇඹිලිපිටිය	64	පුත්තලම
22	ගල්ගමුව	65	පුගොඩ
23	ගම්පහ	66	පේදුරුතුඩුව
24	ගලගෙදර	67	පොල්ගහවෙල
25	ගල්කිස්ස	68	පොළොන්නරුව
26	ගාල්ල	69	පොතුවිල්
27	හම්බන්තොට	70	රත්නපුර
28	හැටන්	71	තඹුත්තේගම
29	හිගුරක්ගොඩ	72	තංගල්ල
30	හෝමාගම	73	තිස්සමහාරාමය
31	හොරණ	74	ත්‍රිකුණාමලය
32	යාපනය	75	සියඹලාණ්ඩුව
33	කඩවත	76	වාලච්චේනිය
34	කඩුවෙල	77	වව්නියාව
35	කල්මුණේ	78	වලස්මුල්ල
36	කළුතර	79	වරකපොල
37	මහනුවර	80	වාරියපොල
38	කන්තලේ	81	වැලිමඩ
39	කැබිතිගොල්ලෑව	82	වැල්ලවාය
40	කෑගල්ල	83	වත්තල
41	කැකිරාව	84	හෙට්ටිපොල
42	කිලිනොච්චිය	85	තෙල්දෙණිය
43	කුලියාපිටිය	86	උඩුගම
		87	බිබිල

නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල ආරම්භ කිරීම, කාර්යය මණ්ඩලය හා ආවරණය කරනු ලබන අධිකරණ


ප්‍රාදේශීය වශයෙන් කොමිෂන් සභාවේ සේවය ලබා දීම උදෙසා පිහිටුවා ඇති කාර්යාල මඟින් ආවරණය කරනු ලබන අධිකරණයන් පහත පරිදි වේ.

අනු අංකය	කාර්යාලය	ආරම්භය	සේවක සංඛ්‍යාව					ආවරණය කරනු ලබන අධිකරණ
			නීතිඥයින්	කළමනාකරණ සහකාර	කාර්යාල සහායක	සංවර්ධන නිලධාරී	රියදුරු	
01	කොළඹ	1978	11	09	03	-	02	ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, කොළඹ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. කම්කරු වන්දි කොමිෂන් සභාව. කොටුව මහේස්ත්‍රාත් අධිකරණය. මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය. ණය සහන මණ්ඩලය ,පරිපාලන විනිශ්චය සභාව.
02	මහනුවර	1994	03	01	-	02	-	මහනුවර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. ගම්පොල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
03	අනුරාධපුරය	1994	02	02	-	-	-	අනුරාධපුර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය. කහටගස්දිගිලිය මහේස්ත්‍රාත් අධිකරණය.
04	ගාල්ල	1994	02	-	01	01	-	ගාල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
05	කුරුණෑගල	1996	03	02	01	-	-	කුරුණෑගල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය ,මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. වැල්ලව මහේස්ත්‍රාත් අධිකරණය. පිලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය. රම්බඩගල්ල මහේස්ත්‍රාත් අධිකරණය.
06	හම්බන්තොට	2003	01	01	01	-	-	හම්බන්තොට දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ. අගුණකොල පැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය.
07	මොණරාගල	2003	02	02	-	-	-	මොණරාගල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ. බිබිල දිසා , මහේස්ත්‍රාත් අධිකරණය.
08	අම්පාර	2003	01	01	-	-	-	අම්පාර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
09	නුවරඑළිය	2003	01	01	-	-	-	නුවරඑළිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව වලපනේ දිසා මහේස්ත්‍රාත් අධිකරණය.
10	කෑගල්ල	2003	02	02		-	-	කෑගල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
11	බලපිටිය	2003	02	02	01	-	-	බලපිටිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. ඇල්පිටිය දිසා මහේස්ත්‍රාත් අධිකරණය.
12	මාතර	2005	03	02	01	-	-	මාතර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
13	චිලියාව	2005	01	01	01	-	-	චිලියාව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
14	අක්කරේපත්තු	2005	01	-	01	01	-	අක්කරේපත්තු දිසා, මහේස්ත්‍රාත් අධිකරණය. කාති අධිකරණය.
15	ත්‍රිකුණාමලය	2005	02	-	01	01	-	ත්‍රිකුණාමලය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ.
16	මඩකලපුව	2005	02	01	01	-	-	මඩකලපුව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ. එරාවුර් මහේස්ත්‍රාත් අධිකරණය. කලවන්චිකුඩි මහේස්ත්‍රාත් අධිකරණය.
17	හලාවත	2005	02	01	01	-	-	හලාවත දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.


අනු අංකය	කාර්යාලය	ආරම්භය	සේවක සංඛ්‍යාව					ආවරණය කරනු ලබන අධිකරණ
			නිලධාරීන්	කළමනාකරණ සහකාර	කාර්යාල සහායක	සංවර්ධන නිලධාරී	රියදුරු	
18	කල්මුනේ	2005	01	02	01	-	-	කල්මුනේ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණය. සමන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණය. කාන්ති අධිකරණය.
19	රත්නපුර	2006	03	02	01	-	-	රත්නපුර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ. පැල්මඩුල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, කම්කරු විනිශ්චය සභාව. කලවාන මහේස්ත්‍රාත් අධිකරණය. කහවත්ත මහේස්ත්‍රාත් අධිකරණය.
20	අවිස්සාවේල්ල	2006	02	01	01	-	-	අවිස්සාවේල්ල දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. රුවන්වැල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
21	බණ්ඩාරවෙල	2006	01	01	01	-	-	බණ්ඩාරවෙල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, කම්කරු විනිශ්චය සභාව.
22	ගම්පහ	2006	02	01	01	-	-	ගම්පහ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව,ණය සහන මණ්ඩලය.
23	යාපනය	2006	01	-	01	-	-	යාපනය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල්අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. කයිට්ස් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
24	කළුතර	2006	02	01	01	-	-	කළුතර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ, කම්කරු විනිශ්චය සභාව.
25	මාතලේ	2006	01	01	01	-	-	මාතලේ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. නාවුල මහේස්ත්‍රාත් අධිකරණය.
26	පොළොන්නරුව	2006	01	01	01	-	-	පොළොන්නරුව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ.
27	පානදුර	2006	02	-	01	01	-	පානදුර දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණ. කැස්බෑව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
28	මහියංගනය	2006	01	01	01		-	මහියංගනය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
29	කුලියාපිටිය	2006	02	01	01	01	-	කුලියාපිටිය දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, කම්කරු විනිශ්චය සභාව. නාරම්මල මහේස්ත්‍රාත් අධිකරණය.
30	මහව	2006	01	01	-	-	-	මහව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
31	මීගමුව	2006	01	01	01	-	-	මීගමුව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, කම්කරු විනිශ්චය සභාව. කණුවන මහේස්ත්‍රාත් අධිකරණය.
32	හොරණ	2007	02	01	-	-	-	හොරණ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
33	මතුගම	2007	02	-	-	-	-	මතුගම දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
34	මාරවිල	2007	01	01	-	-	-	මාරවිල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
35	මාවනැල්ල	2007	01	-	01	02	-	මාවනැල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය. අරණායක මහේස්ත්‍රාත් අධිකරණය.
36	වරකපොල	2007	01	01		-	-	වරකපොල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
37	බත්තරමුල්ල	2007	01	01		-	-	බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය, කම්කරු විනිශ්චය සභාව
38	දඹුල්ල	2007	01	01	01	-	-	දඹුල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය. කිඹිස්ස මහේස්ත්‍රාත් අධිකරණය.
39	අත්තනගල්ල	2007	01	01	01	-	-	අත්තගල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
40	මොරවක/ දෙනියාය	2007	01	01	01	-	-	දෙනියාය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
41	වැලිමඩ	2008	02	01	01	-	-	වැලිමඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
42	නුගේගොඩ	2008	02	01	01	-	-	නුගේගොඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
43	තිස්සමහාරාම	2008	01	01	01	-	-	තිස්සමහාරාම දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
44	තඹුත්තේගම	2008	01	-	01	-	-	තඹුත්තේගම මහේස්ත්‍රාත් අධිකරණය.
45	ගල්කිස්ස	2008	02	01	-	-	-	ගල්කිස්ස දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, සිවිල් අභියාචනාධිකරණය. මොරටුව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
46	කන්තලේ	2008	01	01	-	-	-	කන්තලේ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
47	බද්දේගම	2009	01	02		-	-	බද්දේගම දිසා,මහේස්ත්‍රාත් අධිකරණය.

අනු අංකය	කාර්යාලය	ආරම්භය	සේවක සංඛ්‍යාව					ආවරණය කරනු ලබන අධිකරණ
			නිහඬයින්	කළමනාකරණ සහකාර	කාර්යාල සහායක	සංවර්ධන නිලධාරී	රියදුරු	
48	බදුල්ල	2009	02	-	01	01	-	බදුල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, කම්කරු විනිශ්චය සභාව.
49	ඇඹිලිපිටිය	2009	02	01	01	-	-	ඇඹිලිපිටිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණ.
50	හැටන්	2009	01	-	01	-	-	හැටන් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, කම්කරු විනිශ්චය සභාව.
51	හිඟුරක්ගොඩ	2009	01	-	01	-	-	හිඟුරක්ගොඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය. බකමුණ මහේස්ත්‍රාත් අධිකරණය.
52	නාවලපිටිය	2009	01	01	-	-	-	නාවලපිටිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
53	වැල්ලවාය	2009	01	01	01	-	-	වැල්ලවාය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
54	කඩුවෙල	2010	01	01	01	-	-	කඩුවෙල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
55	මන්නාරම	2010	01	01	01	-	-	මන්නාරම දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
56	මුත්තූර්	2010	01	01	-	-	-	මුත්තූර් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
57	මූලතිව්	2010	-	01	01	-	-	මූලතිව් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
58	තංගල්ල	2010	01	-	-	01	-	තංගල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණය.
59	චාලච්චේනය	2010	02	01	-	-	-	චාලච්චේනය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
60	වලස්මුල්ල	2010	01	01	01	-	-	වලස්මුල්ල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
61	වාරියපොල	2011	01	01	01	01	-	වාරියපොල දිසා, මහේස්ත්‍රාත් අධිකරණය,
62	පේදුරුතුඩුව	2011	01	01	01	-	-	පේදුරුතුඩුව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය,
63	පොතුවිල්	2011	02	01	-	-	-	පොතුවිල් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය,
64	කඩවත	2011	01	01	01	-	-	කඩවත දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
65	කැකිරාව	2011	01	01	01	-	-	කැකිරාව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
66	කිලිනොච්චි	2011	01	01	01	-	-	කිලිනොච්චි දිසා, මහේස්ත්‍රාත් අධිකරණ.
67	වාවකච්චේරි	2011	01	01	-	-	-	වාවකච්චේරි දිසා, මහේස්ත්‍රාත් අධිකරණ
68	බලංගොඩ	2011	01	01	-	-	-	බලංගොඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
69	පූගොඩ	2012	01	01	-	-	-	පූගොඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය,
70	පොල්ගහවෙල	2012	01	01	-	-	-	පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණය.
71	කැබිතිගොල්ලෑව	2012	02	-	01	-	-	කැබිතිගොල්ලෑව දිසා, මහේස්ත්‍රාත් අධිකරණය. පදවිය මහේස්ත්‍රාත් අධිකරණය.
72	ගල්ගමුව	2012	01	01	-	-	-	ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණය,
73	හෝමාගම	2012	01	-	01	-	-	හෝමාගම දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
74	දෙයියන්දර	2012	01	01	-	-	-	දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය.
75	මීනුවන්ගොඩ	2013	02	01	-	-	-	මීනුවන්ගොඩ දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
76	නිකවැරටිය	2013	01	01	01	-	-	නිකවැරටිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණ.
77	මල්ලාහම්	2016	02	01	01	-	-	මල්ලාහම් දිසා, මහේස්ත්‍රාත් අධිකරණය.
78	පුත්තලම	2016	01	-	01	-	-	පුත්තලම දිසා, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණය. කල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය. ආණමඩුව මහේස්ත්‍රාත් අධිකරණය.
79	සියඹලාන්ඩුව	2017	01	-	01	-	-	සියඹලාන්ඩුව මහේස්ත්‍රාත් අධිකරණය.
80	දෙහිඅත්තකණ්ඩිය	2017	01	01	-	-	-	දෙහිඅත්තකණ්ඩිය දිසා, මහේස්ත්‍රාත් අධිකරණය
81	බොරැල්ල	2017	01	-	01	-	-	කම්කරු විනිශ්චය සභාව බොරැල්ල, කම්කරු විනිශ්චය සභාව බත්තරමුල්ල, ණය සහන මණ්ඩලය
82	ගලගෙදර	2017	01	02	-	-	-	ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණ.
83	වත්තල	2018	01	01	01	-	-	මහෙස්ත්‍රාත් අධිකරණ වත්තල, දිසා අධිකරණය වත්තල, කම්කරු විනිශ්චය සභාව වත්තල.
84	හෙට්ටිපොල	2019	01	01	01	-	-	හෙට්ටිපොල මහේස්ත්‍රාත් අධිකරණය.
85	තෙල්දෙණිය	2022	01	01	-	-	-	මහෙස්ත්‍රාත් අධිකරණ තෙල්දෙණිය, මහෙස්ත්‍රාත් අධිකරණය පන්විල මහෙස්ත්‍රාත් අධිකරණය රංගල දිසා අධිකරණය තෙල්දෙණිය
86	උඩුගම	2024	01	-	-	-		උඩුගම දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
87	බිබිල	2025	01	-	-	-		බිබිල මහේස්ත්‍රාත් අධිකරණය

නීති ආධාර කොමිෂන් සභාවේ ආයතනික සංයුතිය



ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව



නීති අංශය



නීති අංශය

1. කාර්ය භාරය

ප්‍රධාන වශයෙන් නීති අංශයේ කාර්යභාරය දෙයාකාරයකි.

1.1 නීති උපදේශන සේවා සිදුකිරීම.

1.2 අඩු ආදායම්ලාභී හා හෝ නොහැකියාවකින් පෙලෙන අයවලුන්ගේ නඩු කටයුතු සඳහා නොමිලේ නීතිඥ සහාය ලබා දීම.

1.1 නීති උපදේශනය

නීති උපදේශන කාර්යය ආකාර කීපයකින් සිදු කරනු ලැබේ. මේ සඳහා යොමු වන සේවාදායකයන් අත්‍යාවශ්‍යයෙන්ම අපගේ කාර්යාල වලට පෞද්ගලිකවම නොපැමිණිය ද උපදේශන කාර්යය සඳහා යොමු වීමේ හැකියාව ඇත.

1. ප්‍රාදේශීයව ස්ථාපිත කොට ඇති නීති ආධාර කාර්යාල වලට පෞද්ගලිකව පැමිණෙන සේවාදායකයින්ගේ ගැටලු සාකච්ඡා කොට පැහැදිලි කර දීමත්, අවශ්‍ය අවස්ථාවල දී ඉදිරි පියවර ගැනීම සඳහා උපදෙස් ලබා දීමත් සිදු කරනවා ඇත.
2. එසේම විවිධ ගම්මාන හෝ ජනාවාස වලට ගොස් ජංගම නීති සායන පැවැත්වීමේ දී එම ස්ථාන වලට පැමිණෙන මහජනතාවට අවස්ථානුකූලව නීති උපදේශන කාර්යය සිදු කරනු ලැබේ.
3. තව ද දෙසතියකට වරක් ලංකාදීප පුවත්පත හරහා සිංහල පාඨකයන් සඳහා “ නීතියේ සරණ” යන නමින් පාඨක නීති ගැටළු වලට පිළිතුරු සැපයීමේ පිටුවක් පළකරනු ලැබේ.
4. සේවාදායකයින් විසින් තැපැල් මාර්ගයෙන් විමසනු ලබන නීති ගැටළු සඳහා ද තැපැල් මාර්ගිකව පිළිතුරු සපයනු ලැබේ.
5. නීති ආධාර කොමිෂන් සභාවේ ක්ෂණික දුරකතන ඇමතුම (Hot Line) හරහා සම්බන්ධ වනු ලබන සේවාදායකයින්ට දුරකථන මඟින් පිළිතුරු සැපයීම සිදු කරනු ලැබේ.

නීති උපදේශනය සැපයීමේ දී නීති ආධාර කොමිෂන් සභාව විසින් සේවාදායකයින්ගේ ආදායම හෝ පුරවැසිභාවය පිළිබඳව සලකා බලනු නොලැබේ. අපගේ කාර්යාලයකට හෝ ජංගම සායනයකට හෝ පැමිණෙන හෝ දුරකතනයෙන් හෝ තැපැල් මාර්ගයෙන් සම්බන්ධවන ඕනෑම පුද්ගලයකුගේ කවරාකාරයේ වූ තරාතිරම් නොසලකා අවශ්‍ය නෛතික උපදේශන කාර්යය අපගේ නීති නිලධාරීන් මඟින් සිදු කරනු ලබනවා ඇත. එසේ හෙයින් මෙය ආර්ථික විශමතාවය පදනම් කොට හුදෙක් එක් පුද්ගල කොට්ඨාසයකට පමණක් ලබා ගත හැකි සුවිශේෂී වරප්‍රසාදයක් නොවේ. මෙය ඕනෑම පුද්ගලයකුට ලබා ගත හැකි සේවයකි.

1.1.1 (A) 2025 වර්ෂයේ නීති උපදේශනයට යොමු වූ සේවාදායකයින් සංඛ්‍යාව

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	පළමුවර උපදේශන සඳහා යොමු වූ සංඛ්‍යාව	නැවත ලබා දුන් උපදේශන සංඛ්‍යාව	එකතුව
1	බස්නාහිර පළාත	අවිස්සාවේල්ල	973	1530	**2503**
2		අත්තනගල්ල	213	885	**1098**
3		බත්තරමුල්ල	309	890	**1199**
4		ප්‍රධාන කාර්යාලය	1871	1385	**3256**
5		ගම්පහ	471	675	**1146**
6		හොරණ	1074	2849	**3923**
7		හෝමාගම	262	733	**995**
8		කඩුවෙල	417	600	**1017**
9		කලුතර	1579	759	**2338**
10		කඩවත	355	888	**1243**
11		මතුගම	321	1268	**1589**
12		ගල්කිස්ස	313	789	**1102**
13		මීනුවන්ගොඩ	272	1056	**1328**
14		මීගමුව	415	1137	**1552**
15		නුගේගොඩ	271	1167	**1438**
16		පානදුර	688	2427	**3115**
17		පූගොඩ	229	621	**850**
18		බොරැල්ල	433	1305	**1738**
19		වත්තල	311	831	**1142**
20	දකුණු පළාත	බද්දේගම	251	1279	**1530**
21		බලපිටිය	442	1382	**1824**
22		දෙනියාය	316	1373	**1689**
23		දෙයියන්දර	297	838	**1135**
24		හම්බන්තොට	573	621	**1194**
25		මාතර	646	2020	**2666**
26		තිස්සමහාරාමය	298	549	**847**
27		තංගල්ල	229	850	**1079**
28		වලස්මුල්ල	379	1561	**1940**
29		ගාල්ල	380	1392	**1772**
30		උඩුගම	58	204	**262**
31	මධ්‍යම පළාත	දඹුල්ල	282	1065	**1347**
32		හැටන්	198	1166	**1364**
33		මහනුවර	899	1601	**2500**
34		මාතලේ	317	607	**924**
35		නුවරඑළිය	303	543	**846**
36		නාවලපිටිය	280	2587	**2867**
37		ගලගෙදර	87	459	**546**
38		තෙල්දෙණිය	245	739	**984**
39	උතුරු මැද පළාත	අනුරාධපුර	575	3634	**4209**
40		හිඟුරක්ගොඩ	330	1284	**1614**
41		කැකිරාව	922	988	**1910**
42		කැබිතිගොල්ලෑව	108	598	**706**
43		පොළොන්නරුව	332	1272	**1604**
44		තඹුත්තේගම	245	469	**714**

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	පළමුවර උපදේශන සඳහා යොමු වූ සංඛ්‍යාව	නැවත ලබා දුන් උපදේශන සංඛ්‍යාව	එකතුව
45	සබරගමුව පළාත	බලංගොඩ	372	50	**422**
46		ඇඹිලිපිටිය	573	3739	**4312**
47		කෑගල්ල	348	818	**1166**
48		මාවනැල්ල	265	1055	**1320**
49		රත්නපුර	515	999	**1514**
50		වරකාපොළ	190	898	**1088**
51	වයඹ පළාත	හලාවත	425	1553	**1978**
52		ගල්ගමුව	211	918	**1129**
53		කුරුණෑගල	1066	644	**1710**
54		කුලියාපිටිය	428	2310	**2738**
55		මහව	317	1013	**1330**
56		මාරවිල	209	1420	**1629**
57		නිකවැරටිය	214	1150	**1364**
58		පොල්ගහවෙල	158	833	**991**
59		පුත්තලම	253	879	**1132**
60		වාරියපොළ	211	591	**802**
61		හෙට්ටිපොළ	241	961	**1202**
62	නැගෙනහිර පළාත	අම්පාර	517	2013	**2530**
63		අක්කරෙයිපත්තුව	319	38	**357**
64		මඩකලපුව	440	816	**1256**
65		කල්මුනේ	320	66	**386**
66		මුත්තූර්	175	76	**251**
67		පොතුවිල්	233	1403	**1636**
68		ත්‍රිකුණාමලය	180	31	**211**
69		වාලච්චෙන	765	297	**1062**
70		දෙහිඅත්තකණ්ඩිය	241	1012	**1253**
71	උතුරු පළාත	කන්තලේ	213	1027	**1240**
72		වාවකච්චේරිය	351	928	**1279**
73		යාපනය	130	712	**842**
74		කිළිනොච්චි	468	1885	**2353**
75		මල්ලාකම්	364	429	**793**
76		මුලතිව්	103	807	**910**
77		පේදුරුතුඩුව	74	887	**961**
78		වව්නියාව	239	120	**359**
79		මන්නාරම	181	346	**527**
80	ඌව පළාත	බදුල්ල	334	2289	**2623**
81		මහියංගනය	295	2242	**2537**
82		මොණරාගල	1214	1539	**2753**
83		වැලිමඩ	360	979	**1339**
84		වැල්ලවාය	295	1474	**1769**
85		සියඹලාණ්ඩුව	333	690	**1023**
86		බණ්ඩාරවෙල	220	1798	**2018**
87		බිබිල	9	59	**68**
සමස්ථ උපදේශන සේවය			**34138**	**94670**	**128808**

1.1.1 (B) 2025 වර්ෂයේ පළමුවරට නීති උපදේශනයට යොමු වූ සේවාදායකයින් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
1	බස්නාහිර පළාත	අවිස්සාවේල්ල	216	757	**973**
2		අත්තනගල්ල	87	126	**213**
3		බන්තරමුල්ල	109	200	**309**
4		ප්‍රධාන කාර්යාලය	845	1026	**1871**
5		ගම්පහ	115	356	**471**
6		හොරණ	203	871	**1074**
7		හෝමාගම	30	232	**262**
8		කඩුවෙල	126	291	**417**
9		කලුතර	520	1059	**1579**
10		කඩවත	67	288	**355**
11		මතුගම	71	250	**321**
12		ගල්කිස්ස	62	251	**313**
13		මිනුවන්ගොඩ	19	253	**272**
14		මීගමුව	88	327	**415**
15		නුගේගොඩ	57	214	**271**
16		පානදුර	183	505	**688**
17		පුගොඩ	49	180	**229**
18		බොරැල්ල	330	103	**433**
19		වත්තල	65	246	**311**
20	දකුණු පළාත	බද්දේගම	71	180	**251**
21		බලපිටිය	140	302	**442**
22		දෙනියාය	75	241	**316**
23		දෙයියන්දර	122	175	**297**
24		හම්බන්තොට	228	345	**573**
25		මාතර	150	496	**646**
26		තිස්සමහාරාමය	88	210	**298**
27		තංගල්ල	34	195	**229**
28		වලස්මුල්ල	160	219	**379**
29		ගාල්ල	90	290	**380**
30		උඩුගම	13	45	**58**
31	මධ්‍යම පළාත	දඹුල්ල	25	257	**282**
32		හැටන්	17	181	**198**
33		මහනුවර	257	642	**899**
34		මාතලේ	69	248	**317**
35		නුවරඑළිය	102	201	**303**
36		නාවලපිටිය	84	196	**280**
37		ගලගෙදර	13	74	**87**
38		තෙල්දෙණිය	41	204	**245**
39	උතුරු මැද පළාත	අනුරාධපුර	92	483	**575**
40		හිඟුරක්ගොඩ	85	245	**330**
41		කැකිරාව	204	718	**922**
42		කැබිනිගොල්ලෑව	21	87	**108**
43		පොළොන්නරුව	113	219	**332**
44		තඹුත්තේගම	31	214	**245**
45	සබරගමුව පළාත	බලංගොඩ	130	242	**372**
46		ඇඹිලිපිටිය	75	498	**573**
47		කෑගල්ල	69	279	**348**
48		මාවනැල්ල	67	198	**265**
49		රත්නපුර	141	374	**515**
50		වරකාපොළ	27	163	**190**


අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
51	වයඹ පළාත	හලාවත	162	263	**425**
52		ගල්ගමුව	72	139	**211**
53		කුරුණෑගල	393	673	**1066**
54		කුලියාපිටිය	105	323	**428**
55		මහව	85	232	**317**
56		මාරවිල	29	180	**209**
57		නිකවැරටිය	69	145	**214**
58		පොල්ගහවෙල	27	131	**158**
59		පුත්තලම	30	223	**253**
60		වාරියපොළ	43	168	**211**
61		හෙට්ටිපොළ	26	215	**241**
62	නැගෙනහිර පළාත	අම්පාර	84	433	**517**
63		අක්කරෙයිපත්තුව	33	286	**319**
64		මඩකලපුව	81	359	**440**
65		කල්මුනේ	10	310	**320**
66		මුත්තූර්	51	124	**175**
67		පොතුවිල්	28	205	**233**
68		ත්‍රිකුණාමලය	25	155	**180**
69		වාලච්වෙන	86	679	**765**
70		දෙහිඅත්තකණ්ඩිය	59	182	**241**
71	උතුරු පළාත	කන්තලේ	34	179	**213**
72		වාවකච්චේරිය	105	246	**351**
73		යාපනය	22	108	**130**
74		කිළිනොච්චි	39	429	**468**
75		මල්ලාකම්	33	331	**364**
76		මුලතිව්	2	101	**103**
77		පේදුරුතුඩුව	2	72	**74**
78		වව්නියාව	15	224	**239**
79		මන්නාරම	25	156	**181**
80	ඌව පළාත	බදුල්ල	281	53	**334**
81		මහියංගනය	48	247	**295**
82		මොණරාගල	326	888	**1214**
83		වැලිමඩ	98	262	**360**
84		වැල්ලවාය	59	236	**295**
85		සියඹලාණ්ඩුව	67	266	**333**
86		බණ්ඩාරවෙල	34	186	**220**
87		බිබිල	1	8	**9**
සමස්ථ උපදේශන සේවය			**8765**	**25373**	**34138**

1.1.1 (C) වර්ෂ 2015 සිට 2025 දක්වා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව විසින් නීති උපදේශන සිදු කිරීම සංඛ්‍යාත්මකව

අනු අංකය	වර්ෂය	නීති උපදේශන ලබා දුන් සංඛ්‍යාව
1	2015	76779
2	2016	92725
3	2017	98369
4	2018	121197
5	2019	125895
6	2020	90058
7	2021	81926
8	2022	119736
9	2023	130858
10	2024	127028
11	2025	128808

1.1.1 (D).1 වර්ෂ 2015 සිට 2025 දක්වා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව විසින් නීති උපදේශන සිදු කිරීම ප්‍රස්ථාර නිරූපණය

ක




1.1.2 (E).2 වර්ෂ 2022, 2023 සහ 2024 වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂයේ නීති උපදේශන ප්‍රගතිය

2022 හා 2024 වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂයේ නීති උපදේශන සඳහා සේවාදායකයන්ගේ පැමිණීම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව දක්නට ලැබේ. පසුගිය 2022 සහ 2024 වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂයේදී ජනතාව අතර ඇතිවූ නීති සම්බන්ධ අවබෝධය වැඩිවීම, ආර්ථික හා සමාජීය තත්ත්වවල වෙනස්කම්, සහ නීතිමය ගැටලු ඉහළ යාම වැනි කරුණු හේතුවෙන් උපදේශනයට යොමු වීම වැඩි වී ඇත. ඒ අනුව, 2025 වර්ෂය නීති උපදේශන ක්ෂේත්‍රයේ සක්‍රීය වර්ධනයක් සහ වැඩි ප්‍රතිචාරයක් පෙන්නුම් කරන වර්ෂයක් ලෙස හඳුනාගත හැක. එමෙන්ම කොවිඩ් වසංගතයෙන් පසු 2023 වර්ෂයේ උපදේශන ලබා ගැනීම් වසර 10 ක් තුළ සිදු වූ වැඩිම උපදේශන ලබා ගත් වසර ලෙස සැලකේ.


.1.1. (F).2 2022,2023 සහ 2024 වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂයේ නීති උපදේශන ප්‍රගතිය ප්‍රස්ථාර නිරූපණය

අනු අංක	වර්ෂය	සංඛ්‍යාව	ප්‍රතිශතය
02	2022	119736	26.06%
03	2023	130858	28.48%
04	2024	127028	27.64%
05	2025	128808	28.03%
එකතුව		**459548**	**100%**



1.1.1. (G).3 නීති ආධාර කොමිෂන් සභාව 2025 වර්ෂයේ අවසන් වූ නඩු මඟින් සේවාදායකයින්ට හිමි වූ ප්‍රතිලාභ (පළාත් අනුව)

අනු අංකය	පළාත	ලබා ගත් වන්දි මුදල(රු.)
01	බස්නාහිර පළාත	148,536,797.24
02	දකුණු පළාත	36,903,000.00
03	මධ්‍යම පළාත	8,264,000.00
04	උතුරු මැද පළාත	38,473,350.00
05	සබරගමුව පළාත	15,300,000.00
06	වයඹ පළාත	49,621,497.11
07	නැගෙනහිර පළාත	11,482,000.00
08	උතුරු පළාත	10,005,000.00
09	ඌව පළාත	17,300,000.00
	එකතුව	**335,885,644.35**



1.2 අධිකරණමය කටයුතු

පුද්ගලයන්ගේ අධිකරණමය කටයුතු වෙනුවෙන් නීතිඥ සහාය ලබා දීම නීති අංශයේ ඉතාම වැදගත් කාර්යය භාරයයි. යමෙකුගේ නීති ගැටළුවක් වෙනුවෙන් අධිකරණය තුළ නඩුවක් පවත්වාගෙන යාමට අවශ්‍ය වන අවස්ථාවක දී එම පුද්ගලයා වෙනුවෙන් නීති ආධාර ලබාදිය හැකි ද යන්න පළමුව සොයා බැලේ. නීති උපදේශනය සිදුකිරීමෙන් එකී කාර්ය සඳහා ප්‍රවේශයක් ලබාගැනීමට හැකියාව ඇත. නීති ආධාර ලබාදීමේ නඩු කටයුතු පවත්වාගෙන යාමේ දී පළමුව සොයා බැලෙන්නේ මෙම සේවාදායකයා වෙනුවෙන් නොමිලේ නීතිඥ සහාය ලබාදීම යුක්ති යුක්ත ද යන්නයි. ඒ සඳහා ඔහුගේ ආර්ථික තත්ත්වය පිළිබඳව තීරණයක් ලබාගැනීම සඳහා ඔහුගේ මාසික ආදායම පිළිබඳව ග්‍රාම නිලධාරී වාර්තාව කැඳවීම මුලින්ම සිදුකරනු ලබයි.

මෙහි දී,

1. පුද්ගලයකුගේ මාසික ආදායම පිළිබඳ වාර්තාව ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබා ගෙන එය ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අනු සහතික කිරීමෙන් පසු ඔහු අඩු ආදායම්ලාභියකු බවට මෙම වාර්තා ප්‍රකාරව සනාථ වන්නේ නම් එවැනි පුද්ගලයකුගේ අධිකරණමය කටයුතු වෙනුවෙන් නීති ආධාර ලබා දීමේ ප්‍රතිපත්ති ප්‍රකාරව නොමිලේ නීතිඥ සහාය ලබා දීමට කටයුතු කරනවා ඇත.
2. ප්‍රමාණවත් ආදායම්ලාභියකු වුද යම් පුද්ගලයකුගේ නඩු කටයුත්තක් සඳහා කිසිදු නීතිඥයකුගේ සහාය ලබා ගත නොහැකි ද? නීතිඥවරයකු යම් නඩුවක පාර්ශවයක් වන්නේ ද? යම් නඩුවක පාර්ශවයක් විසින් නීතිඥවරුන් හට බලපෑමක් සිදු කර අනෙක් පාර්ශවය වෙනුවෙන් නීතිඥ පෙනී සිටීමක් වලක්වන්නේ ද? එවැනි අවස්ථාවක දී යුක්තිය ඉටු කිරීමට සහය වීම වෙනුවෙන් අධිකරණයට අවශ්‍ය සහයෝගය ලබා දීම කෙරෙහි නීති ආධාර කොමිෂන් සභාවේ අවධානය නිරන්තරවම යොමු කරනු ලැබේ. මෙවැනි අවස්ථාවක දී පාර්ශවකරුගේ ආදායම් මට්ටම නොසලකා අවශ්‍ය නීතිඥ නියෝජනය ලබා දීම කෙරෙහි නීති ආධාර කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ.
3. එසේම යම් තැනැත්තකු වසරකට වඩා කාලයක් බන්ධනාගාර ගතව ඇති නමුත් නීතිඥ සහාය ලබා ගැනීමට නොහැකි වී ඇති අවස්ථාවලදී එවැනි තැනැත්තන් වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥ සහාය ලබා දීමට කටයුතු කර ඇති අතර මේ වන විට පවතින බන්ධනාගාර තදබදය අවම කර ගැනීම උදෙසා වසරක කාලය නොසලකා නීතිඥ සහය ලබා ගත නොහැකි රැඳවියන්ට නීතිඥ සේවා ලබා දෙන ලබන අතර ආදායම් තත්ත්වය සලකා බලනු නොලැබේ.
4. ළමයින් සම්බන්ධ නඩු කටයුතු වල දී ළමයාගේ අයිතිවාසිකම් උදෙසා ද,
5. නඩත්තු පනත හා වැඩිහිටි අයිතිවාසිකම් පනත යටතේ නඩත්තු කටයුත්තක දී ද ඉල්ලුම්කාරියගේ හෝ ඉල්ලුම්කරුගේ ආදායම නොසලකා නොමිලේ නීතිඥ සහාය ලබා දීමට කටයුතු කරනවා ඇත.
6. සමෘද්ධිලාභීන්
7. රණවිරුවකන් වෙනුවෙන් ද නොමිලේ නීතිඥ සහාය ලබා දීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරයි.

ඒ වෙනුවෙන් නීති අංශය තුළ සිවිල් හා අපරාධ යන ක්ෂේත්‍ර දෙකේම මනා ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යා යුතු වේ.


දිවයිනේ පිහිටි සෑම මහේස්ත්‍රාත් අධිකරණයකම ද, දිසා අධිකරණයකමද, මහාධිකරණයකම ද, පළාත්බද සිවිල් අභියාචනාධිකරණයකම ද, අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය යන සියලුම අධිකරණ වල නඩු කටයුතු අරභයා ද, කම්කරු විනිශ්චය සභාව, කම්කරු වන්දි විනිශ්චය සභාව, ණය සහන මණ්ඩලය, කාන්ති මණ්ඩලය, පරිපාලන විනිශ්චය සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව යන විනිශ්චයාධිකාරයන් තුළ ද නඩු කටයුතු පවත්වාගෙන යෑම සිදු කර ඇත. තව ද, සමඵ මණ්ඩලයට, කම්කරු කොමසාරිස් දෙපාර්තුමේන්තුවට, කාන්ති අධිකරණයට හා අධිකාරී බලය සහිත වෙනත් ආයතන වල පවත්නා නෛතික ගැටළු වල දී නීතිඥවරුන් පෙනී නොසිටිය ද අවශ්‍ය යොමු කිරීම් නිසි ලෙස සිදු කර ගැනීමට අවශ්‍ය මග පෙන් වීම නීති අංශය තුළින් සිදු කරනු ලැබ ඇත.

අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තුමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කාන්තා කටයුතු හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමග එක්ව එම ආයතන වලින් යොමු කරනු ලබන සේවාදායකයින්ගේ අධිකරණමය කටයුතු සඳහා අවශ්‍ය සහය ලබාදෙනු ලැබේ.

1.2.1. 2025 වර්ෂයේ නීති ආඥාර කොමිෂන් සභාවේ නීති අංශයේ ප්‍රගතිය

නඩු පිළිබඳ විස්තරය	නඩු ප්‍රමාණය
2025.01.01 දිනට පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව	26,342
2025 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අළුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව	12,654
ඒ අනුව 2025 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට පැවැති මුළු නඩු ගණන	38,996
2025 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අවසන් - බහා තබනු ලැබූ නඩු සංඛ්‍යාව	14,027
2025 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ඉදිරියට රැගෙන ගිය නඩු සංඛ්‍යාව	24,969
2025 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා දෙනු ලැබූ මුළු උපදේශන සංඛ්‍යාව	128,808
2025 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරනු ලැබූ සමස්ථ සේවය	**38,996 + 128,808 = 167,804**


(නීති ආඥාර කොමිෂන් සභාවේ සංගණනය වසර 10කට පසුව 2024 වර්ෂයේ සිදු කරන ලද අතර එහිදී නඩු විශාල ප්‍රමාණයක් අවසන් කරන ලදී. තව ද Laid By කර දිගු කාලයක් පැවති නඩු ද අවසන් කරන ලදී. සෑම වර්ෂයකම සාමාන්‍යයෙන් අවසන් කරන ලද නඩු 10000 – 14000 අතර ප්‍රමාණයක් ගන්නා ලද අතර 2024 වැඩි අගයක් පෙන්නුම් කරන ලද්දේ ඉහත කී වසර 10ට පසුව සිදු කළ සංගණනය මත පැවැති සංඛ්‍යාව දත්ත යාවත්කාලීන කිරීම නිසාවෙනි. විවිධාකාරයෙන් නඩු අවසන් වීම සිදු වේ. එහි දී නඩු තීන්දුවක් මඟින් ද සමථ වීම් මඟින් ද, ඒක පාර්ශවික විභාගයට ගෙන ද, නිෂ්ප්‍රභා වීමෙන් ද, ඉල්ලා අස් කර ගැනීමෙන් ද, බහා තැබීමෙන් ද, ප්‍රතික්ෂේප වීමෙන් ද නඩු අවසන් වේ.එමෙන් ම නීතිමය කරුණු මත, ප්‍රතික්ෂේප වූ ද බහා තබන්නා වූ ද, නිෂ්ප්‍රභා වූ ද නඩු, අවසන් නඩු ගණයට වැටේ. තව ද නඩු අවසන් කිරීම හෝ අවසන් වීම කෙරෙහි ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රියාවලි සමඟ සෘජුව සම්බන්ධව පවතින්නක් වන අතර එය නීති ආඥාර කොමිෂන් සභාවේ පාලනයෙන් තොර වේ. ඒ අනුව සෑම වසරකම ඉදිරියට ගෙන එන නඩු ශේෂයක් පවතී.)



1.2.2. 2025 වර්ෂයේ නීති ආධාර කොමිෂන් සභාවේ පළාත් මට්ටමින් ලබා දී ඇති සේවය.

පළාත	නීති උපදේශන 2025.01.01 සිට 2025.12.31 දක්වා	පවත්වාගෙන ගිය නඩු 2025.01.01 සිට 2025.12.31 දක්වා	2025 වසර තුල ලබා දුන් සමස්ථ නීති සේවය
බස්නාහිර පළාත	32,572	9,319	41,891
ඌව පළාත	14,130	3,928	18,058
දකුණු පළාත	15,938	4,249	20,187
උතුරු පළාත	8,024	3,886	11,910
සබරගමුව පළාත	9,822	3,345	13,167
වයඹ පළාත	16,005	4,102	20,107
මධ්‍යම පළාත	11,378	3,348	14,726
නැගෙනහිර පළාත	10,182	4,070	14,252
උතුරු මැද පළාත	10,757	2,749	13,506
එකතුව	**128,808**	**38,996**	**167,804**
ලබා දුන් මුළු සේවය = පවත්වාගෙන ගිය මුළු නඩු සංඛ්‍යාව + ලබා දුන් මුළු උපදේශන සංඛ්‍යාව			
167,804 =	**38,996**	+	**128,808**

2025 වර්ෂයේ පළාත් මට්ටමින් ලබා දී ඇති සේවය



1.2.3. 2025 ජනවාරි 01 වන දින සිට 2025 දෙසැම්බර් 31 අතරතුර පැවති නඩු සහ උපදේශන සංඛ්‍යාව

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	නීති අංශයේ රාජකාරි කරන සේවක මණ්ඩලය			2024.12.31 දිනට පැවති නඩු	ගොනු කරන ලද නඩු (ජන-දෙසැ 2025)	එකතුව	අවසන් කල නඩු	ලබා නැබුණු නඩු	ඉදිරියට ගෙන එන ලද නඩු (31.12.2025)	උපදේශන එකතුව
			නීති නිලධාරී	කළමනාකරණ සහකාර	කාර්යාල සහායක							
1	බස්නාහිර පළාත	අවිස්සාවේල්ල	2	1	1	288	149	437	88	52	297	**2503**
2		අත්තනගල්ල	1	1	1	313	130	443	109	7	327	**1098**
3		බත්තරමුල්ල	2	1	0	240	112	352	29	9	314	**1199**
4		ප්‍රධාන කාර්යාලය	7	7	3	869	481	1350	238		1112	**3256**
5		ගම්පහ	2	1	1	259	156	415	87	67	261	**1146**
6		හොරණ	2	1	1	506	356	862	215	167	480	**3923**
7		හෝමාගම	1	0	1	165	120	285	95	38	152	**995**
8		කඩුවෙල	1	1	0	180	113	293	115		178	**1017**
9		කලූතර	2	1	1	643	159	802	105		697	**2338**
10		කඩවත	1	1	1	300	104	404	84	48	272	**1243**
11		මතුගම	2	1	1	194	132	326	59	19	248	**1589**
12		ගල්කිස්ස	2	1	0	438	98	536	167	17	352	**1102**
13		මිනුවන්ගොඩ	2	1	0	608	149	757	144	48	565	**1328**
14		මීගමුව	2	1	1	277	94	371	119	26	226	**1552**
15		නුගේගොඩ	1	1	1	300	123	423	70	61	292	**1438**
16		පානදුර	2	1	1	285	223	508	139	115	254	**3115**
17		පුගොඩ	1	1	0	129	107	236	132		104	**850**
18		බොරැල්ල	1	0	1	159	143	302	167	4	131	**1738**
19		වත්තල	1	1	1	107	110	217	63	34	120	**1142**
20	දකුණු පළාත	බද්දේගම	2	1	0	461	127	588	142	211	235	**1530**
21		බලපිටිය	2	2	1	277	195	472	187		285	**1824**
22		දෙනියාය	1	1	1	206	171	377	155		222	**1689**
23		දෙයියන්දර	1	1	0	193	115	308	151	4	153	**1135**
24		හම්බන්තොට	1	1	1	223	115	338	47		291	**1194**
25		මාතර	3	2	1	386	241	627	242		385	**2666**
26		නිස්සමහාරාමය	1	1	1	233	182	415	74	114	227	**847**
27		තංගල්ල	1	2	0	237	111	348	54	46	248	**1079**
28		වලස්මුල්ල	1	1	1	306	131	437	47	98	292	**1940**
29		ගාල්ල	1	1	1	138	122	260	47	49	164	**1772**
30		උඩුගම	1				79	79	20	23	36	**262**
31	මධ්‍යම පළාත	දඹුල්ල	1	1	1	183	135	318	137		181	**1347**
32		හැටන්	1	0	1	150	127	277	125	15	137	**1364**
33		මහනුවර	3	2	0	484	156	640	151		489	**2500**
34		මාතලේ	1	1	0	410	239	649	115	204	330	**924**
35		නුවරඑළිය	1	1	0	644	139	783	186		597	**846**
36		නාවලපිටිය	1	1	0	218	180	398	67	144	187	**2867**
37		ගලගෙදර	1	2	0	70	**28**	98	**11**	**15**	**72**	**546**
38		තෙල්දෙණිය	1	1	0	126	59	185	46	36	103	**984**
39	උතුරුමැද පළාත	අනුරාධපුර	2	2	1	694	376	1070	315	94	661	**4209**
40		හිඟුරක්ගොඩ	1	1	1	207	144	351	81	30	240	**1614**
41		කැකිරාව	1	1	0	243	149	392	103	95	194	**1910**
42		කැබිතිගොල්ලෑව	1	1	0	193	169	362	65	64	233	**706**
43		පොළොන්නරුව	1	1	0	122	132	254	48	42	164	**1604**
44		තඹුත්තේගම	1	0	1	228	92	320	67	52	201	**714**

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය	නීති අංශයේ රාජකාරී කරන සේවක මණ්ඩලය			2024.12.31 දිනට පැවති නඩු	ගොනු කරන ලද නඩු (ජන-දෙසැ 2025)	එකතුව	අවසන් කළ නඩු	බහා තැබූ නඩු	ඉදිරියට ගෙන එන ලද නඩු (31.12.2025)	උපදේශන එකතුව
			නීති නිලධාරී	කළමනාකරණ සහකාර	කාර්යාල සහායක							
45	සබරගමුව පළාත	බලන්ගොඩ	1	1	0	194	145	339	87	16	236	**422**
46		ඇඹිලිපිටිය	2	1	1	715	263	978	170	260	548	**4312**
47		කෑගල්ල	2	2	0	184	124	308	27	31	250	**1166**
48		මාවනැල්ල	1	1	1	364	101	465	64	207	194	**1320**
49		රත්නපුර	2	2	0	795	228	1023	186		837	**1514**
50		වරකාපොළ	1	1	0	125	107	232	76		156	**1088**
51	වයඹ පළාත	හලාවත	1	1	1	404	121	525	138		387	**1978**
52		ගල්ගමුව	1	1	0	191	97	288	36	33	219	**1129**
53		කුරුණෑගල	3	2	1	399	204	603	65	57	481	**1710**
54		කුලියාපිටිය	1	2	1	285	249	534	143	93	298	**2738**
55		මහව	1	1	0	153	120	273	61	42	170	**1330**
56		මාරවිල	1	1	0	233	134	367	91	52	224	**1629**
57		නිකවැරටිය	1	1	1	108	109	217	55	59	103	**1364**
58		පොල්ගහවෙල	1	1	0	93	116	209	27	75	107	**991**
59		පුත්තලම	1	0	0	273	298	571	78	92	401	1132
60		චාරියපොළ	1	2	0	120	91	211	46	27	138	**802**
61		හෙට්ටිපොළ	1	1	1	189	115	304	60	41	203	**1202**
62	නැගෙනහිර පළාත	අම්පාර	1	1	0	278	161	439	101	54	284	**2530**
63		අක්කරෙයිපත්තුව	1	1	1	324	172	496	243	6	247	**357**
64		මඩකලපුව	2	1	1	277	113	390	64	1	325	**1256**
65		කල්මුනේ	1	2	1	272	171	443	174	56	213	**386**
66		මුත්තූර්	1	1	0	355	102	457	286	27	144	**251**
67		පොතුවිල්	2	1	0	142	153	295	61	26	208	**1636**
68		ත්‍රිකුණාමලය	1	1	1	171	42	213	65	7	141	**211**
69		චාලච්චෙන	1	0	0	371	298	669	128	409	132	**1062**
70		දෙහිඅත්තකණ්ඩිය	1	1	0	264	84	348	59	23	266	**1253**
71		කන්තලේ	1	1	0	235	85	320	84		236	**1240**
72	උතුරු පළාත	වාවකච්චේරිය	1	1	0	363	101	464	56		408	**1279**
73		යාපනය	2	1	1	242	89	331	24		307	**842**
74		කිළිනොච්චි	1	1	1	762	100	862	459	68	335	**2353**
75		මල්ලාකම්	1	1	1	277	54	331	48	11	272	**793**
76		මූලතිව්	1	1	1	421	68	489	58	62	369	**910**
77		පේදුරුතුඩුව	1	1	1	233	75	308	49	26	233	**961**
78		වව්නියාව	1	1	1	454	109	563	106	24	433	**359**
79		මන්නාරම	1	1	1	496	42	538	103		435	**527**
80	ඌව පළාත	බදුල්ල	1	1	1	397	137	534	97	32	405	**2623**
81		මහියංගනය	1	1	1	419	108	527	89	60	378	**2537**
82		මොණරාගල	2	2	0	491	233	724	353	88	283	**2753**
83		වැලිමඩ	1	1	1	378	130	508	147	23	338	**1339**
84		වැල්ලවාය	1	1	1	441	177	618	127	155	336	**1769**
85		සියඹලාණ්ඩුව	1	0	1	268	125	393	28	65	300	**1023**
86		බණ්ඩාරවෙල	1	1	1	294	145	439	108	79	252	**2018**
87		බිබිල					185	185	77	80	28	**68**
4			2025.08.23	-ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මොරටුව		සමෘද්ධිලාභීන්	51
5			2025.09.13	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කලුතර	ප්‍රධාන කාර්යාලය	සමෘද්ධි නිලධාරීන් සහ සමෘද්ධිලාභීන්	48
6			2025.10.25	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉංගිරිය	ප්‍රධාන කාර්යාලය	සමෘද්ධි නිලධාරීන් සහ සමෘද්ධිලාභීන්	55
7			2025.01.31	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙල්ලවීදිය, කොළඹ 12	ප්‍රධාන කාර්යාලය	සමෘද්ධි නිලධාරීන් සහ සමෘද්ධිලාභීන්	48
8	A-2 නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්නීති / සායන ප්‍රදර්ශන සහ ජාත්‍යන්තර දින සැමරීමේ වැඩසටහන්	ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති සායන පැවැත්වීම.	2025.11.04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දෙවිනුවර	මාතර	ධීවර ජනතාව	54
9			2025.11.10	ධීවර දෙපාර්තමේන්තු කාර්යාලය මන්නාරම	මන්නාරම	ධීවර ජනතාව	70
10			2025.11.17	මාන්යවේලි ප්‍රජා ශාලාව ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය	ධීවර ජනතාව	65

11			2025.09.23	අම්බලන්ගොඩ ගලගොඩ ප්‍රජා ශාලාව	බලපිටිය	ධීවර ජනතාව	52
12		විශේෂ හැකියාවන් ඇති තැනැත්තන් (Differently able person)	2025.09.30	රන්කොත් විහාරය, පානදුර	පානදුර	විශේෂ හැකියාවන් ඇති ප්‍රජාව	50
13			2025.10.31	බිහිරි පාසල - රත්මලාන	ගල්කිස්ස	විශේෂ හැකියාවන් ඇති දරුවන්	61
14			2025.09.23	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුණෑගල	කුරුණෑගල	ආබාධිත පුද්ගලයන්	138
15		නිදහස් වෙළඳ සේවකයින්	2025.09.03	තිනුලි ෆැෂන් ආයතනය, කිරිදිවැල	පූගොඩ	ඇඟලුම් සේවිකාවන්	56
16			2025.11.04	ගංගාරාම විහාරස්ථානය, උක්වත්ත	කලුතර	ඇඟලුම් සේවකයන්	60
17			2025.06.25	මාස් ෆැබ්රික් ආයතනය, තුල්හිරිය	පොල්ගහවෙල	සේවකයන්	10
18			2025.08.21	මාස් ආයතනය තුරුලිය	වරකාපොල	ඇඟලුම් සේවිකාවන්	50
19		වතු කම්කරුවන්	2025.07.30	මහජන පුස්තකාල ශ්‍රවණාගාරය - නුවරඑළිය	නුවරඑළිය	වතු කම්කරුවන්	50
20			2025.08.28	ඉඹුල්පිටිය වත්ත - නාවලපිටිය	නාවලපිටිය	වතු කම්කරුවන්	55
21			2025.07.30	මාරතැන්න වත්ත - බලංගොඩ	බලංගොඩ	වතු කම්කරුවන්	63
22			2025.11.20	උඩගම විහාරස්ථානය	මාවනැල්ල	වතු කම්කරුවන්	85
23			2025.09.25	රත්නපුර ෆාම් ගාඩ්න් වතුයාය රැස්වීම් ශාලාව	රත්නපුර	වතු කම්කරුවන්	70
24			2025.10.03	ප්‍රාදේශීය සභාව, වැලිමඩ	වැලිමඩ	වතු කම්කරුවන්	60
25		ප්‍රදර්ශන	2025.03.06 ,07	ජාත්‍යන්තර කාන්තා දින සමරු ජාතික වැඩසටහන හා ප්‍රදර්ශනය විහාර මහා දේවි උද්‍යානය - ලිය ශක්ති) 2025)	ප්‍රධාන කාර්යාලය	කාන්තාවන්	-
26		ජාත්‍යන්තර දින වැඩසටහන්	2025.03.07	රෝයල් මෝල් හෝටල් පරිශ්‍රය නුවර	මහනුවර	කාන්තාවන්	49
27	A-3 නීතිය සම්බන්ධයෙන් පාසල් සිසුන්	නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	2025.11.06	බපසංඝ/ගම්/ බෝධි ජාතික පාසල, නිට්ටඹුව	අත්තනගල්ල	පාසල් සිසුන්)10 වසර සිසුන්(	356

28	දැනුවත් කිරීමේ වැඩසටහන්		2025.10.30	නාලන්දා විද්‍යාලය	ප්‍රධාන කාර්යාලය	පාසල් සිසුන්	200
29			2025.11.06	නාත්/ ඉසිපතන කණිටු විදුහල	මාරවිල	පාසල් සිසුන්	60
30			2025.08.20	කුලිරත්මල්ල/ ශ්‍රී අරියවංශ මහවිදුහල - කටුපොත	වාරියපොල	පාසල් ළමුන්	73
31			2025.10.16	බැසිලිකා විද්‍යාලය - රාගම	වත්තල	සිසුන්	125
32			2025.11.04	ලුණුගම්වෙහෙර මහා විද්‍යාලය	තිස්සමහාරාමය	අ:ස:පො: උසස් පෙළ පාසල් සිසුන්.	70
33	A-4 නීතිය සම්බන්ධයෙන්ආ/ රක්ෂාව හා රැකවරණය සම්බන්ධයෙන් වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	නීතිය සම්බන්ධයෙන් වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සායන පැවැත්වීම	2025.08.14	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හෝමාගම	හෝමාගම	වැඩිහිටියන්	60
34			2025.11.04	යද්දිගම මීමුත්තා වැඩිහිටි නිවාසය	මහව	වැඩිහිටියන්	55
35			2025.11.04	පවුසි මාවත, කලාඔය ප්‍රජා ශාලාව	ගල්ගමුව	වැඩිහිටියන්	60
36			2025.08.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මොණරාගල	මොණරාගල	වැඩිහිටියන්	60
37			2025.08.05	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාරම්මල	කුලියාපිටිය	වැඩිහිටියන්	59
38			2025.11.10	BT/KK/ කිරාන් මධ්‍ය විද්‍යාලය	වාලවිවේන	වැඩිහිටියන්	60
39	A-5 කාන්තා අයිතිවාසියකම් / ළමා /අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්	ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කාන්තා / ගැහැණු හිංසනය දරුවන්ගේ ආරක්ෂාවට අදාල නීතීන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම	2025.07.30	මීදෙල්ලමුල හේන ප්‍රජා ශාලාව	හොරණ	කාන්තාවන්	59
40			2025.08.13	ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය - නාත්තණ්ඩිය	මාරවිල	රාජ්‍ය නිලධාරීන්	60
41			2025.07.30	මන්දනෙ - තිරුක්කෝවිල්	අක්කරෙයිපත්තු	සමෘද්ධිලාභීන්	71
42			2025.09.19	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දෙහිඅත්තකණ්ඩිය	දෙහිඅත්තකණ්ඩිය	මහජනතාව	43
43			2025.03.10	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම	බද්දේගම	කාන්තාවන්	150
44			2025.11.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්පාර	අම්පාර	කාන්තාවන්	50

45			2025.11.03	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අලව්ව	පොල්ගහවෙල	කාන්තාවන්	48
46			2025.10.11	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දියතලාව	බණ්ඩාරවෙල	කාන්තාවන්	60
47			2025.03.08	කාන්තා දින වැඩසටහන	ප්‍රධාන කාර්යාලය	කාන්තාවන්	67
48		ක්ෂුද්‍ර මූල්‍යකරණයේ විනිදිතයින් ආරක්ෂා කිරීමේ නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	2025.08.26	සංස්කෘතික මධ්‍යස්ථානය කැලණිය -	කඩවත	මහජනතාව	45
49			2025.08.12	නල්ලච්චිය ප්‍රජා ශාලාව - තඹුත්තේගම	තඹුත්තේගම	සාමාන්‍ය ජනතාව	36
50			2025.08.25	හුලෝදර ගැමුණු මරණාධාර සමිති ශාලාව	නිකවැරටිය	සාමාන්‍ය ජනතාව	60
51			2025.07.23	පොතුවිල්	පොතුවිල්	සාමාන්‍ය ජනතාව	63
52		මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීම	2025.10.03	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මීගමුව	මීගමුව	අස්වැසුම්ලාභී කාන්තාවන්	55
53			2025.09.02	කරුණාරත්න බෞද්ධ විද්‍යාලය	වත්තල	උසස්පෙළ දරු දැරියන් සහ ගුරුවරුන්	59
54			2025.08.28	ප්‍රජා ශාලාව දියදාව, කොටපොල	දෙනියාය (මොරවක(	මහජනතාව	60
55			2025.10.21	ජාතික තරුණ සේවා සභාව, හලාවත	හලාවත	තරුණ ප්‍රජාව	60
56		පරිගණක අපරාධ සම්බන්ධයෙන් දැනුවත් කිරීම (Cyber Crimes)	2025.09.26	SMI ආයතන ශ්‍රවණාගාරය	ගම්පහ	මහජනතාව	54
57			2025.08.26	Esoft metro campus ආයතනය, ගාල්ල	ගාල්ල	සිසුන්	66
58		විදේශගත ශ්‍රමිකයන් ගේ ආරක්ෂාවට අදාල නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	2025.07.31	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මුලටියන	දෙයියන්දර	ජනතාව	66
59			2025.09.16	ශක්ති අවමංගල්‍යාධාර සමිතිය, ගිරිතලේ ජනපදය	හිගුරක්ගොඩ	මහජනතාව	43
60			2025.09.08	ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කැකිරාව	මහජනතාව	46
61			2025.07.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය	සාමාන්‍ය ජනතාව	61

62			2025.08.21	බෙලිගම්මන රජමහා විහාරස්ථානය	මාවනැල්ල	ජනතාව	75
63			2025.09.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හෙට්ටිපොල	හෙට්ටිපොල	මහජනතාව	80
64			2025.07.30	බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය	බද්දේගම	විදේශගත ශ්‍රමිකයන්	81
65			2025.08.14	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මහියංගණය	මහියංගණය	ජනතාව	63
66			2025.10.03	බුද්ධාම පන්සල	සියඹලාණ්ඩුව	ජනතාව	38
67		මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම.	2025.09.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිනුවන්ගොඩ	මිනුවන්ගොඩ	ප්‍රජාමූල බැංකුවල මහජන ප්‍රධානීන්	55
68			2025.09.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය, ගලගෙදර	ගලගෙදර	ග්‍රාම නිලධාරීන්	64
69			2025.08.14	මෝටර් රථ තාක්ෂණ විද්‍යාලය - බෙලිඅත්ත	තංගල්ල	සිසුන්	112
70			2025.09.30	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල	කෑගල්ල	සංවර්ධන නිලධාරීන්	56
71	A-6 බන්ධනාගාර වැඩසටහන්	සිරකරුවන් සහ පුනරුත්ථාපන රැඳවියන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා සායන	2025.02.28	Magazin බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	50
72			2025.02.21	කොලඹ රිමාන්ඩ් බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	45
73			2025.09.21	කලුතර බන්ධනාගාරය	හොරණ	බන්ධනාගාර රැඳවියන්	26
74			2025.07.08	මහර බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	55
75			2025.05.15	කොලඹ රිමාන්ඩ් බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	50
76			2025.06.13	Magazin බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	60
77			2025.07.15	Magazin බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැඳවියන්	50
78			2025.05.29	බන්ධනාගාරය	හොරණ	බන්ධනාගාර රැඳවියන්	50
79			2025.06.03	තෘතියික හා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය	පොළොන්නරුව	බන්ධනාගාර රැඳවියන්	75

80			2025.06.02	පූන්තෝට්ටම් වවුනියා	වව්නියාව	පුනරුත්ථාපන රැදවියන්	100
81			2025.09.09	Magazine බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර රැදවියන්	55
82			2025.09.17	කලූතර බන්ධනාගාරය	පානදුර	බන්ධනාගාර රැදවියන්	30
83			2025.05.23	පොළොන්නරුව	පොළොන්නරුව	පුනරුත්ථාපන රැදවියන්	47
84		බන්ධනාගාර නිලධාරීන් දැනුවත් කිරීම	2025.11.07	කොලඹ රිමාන්ඩ් බන්ධනාගාරය	ප්‍රධාන කාර්යාලය	බන්ධනාගාර නිලධාරීන් හා රැදවියන්	50
85		පරිවාස මධ්‍යස්ථාන සහ ළමා රැඳවුම් මධ්‍යස්ථාන වැඩසටහන	2025.09.29	බස්නාහිර පළාත් සභා ශ්‍රවණාගාරය, බත්තරමුල්ල	බත්තරමුල්ල	පරිවාස නිලධාරීන් ළමා රක්ෂක ඒකක නිලධාරීන් , ළමා රැදවුම් මධ්‍යස්ථාන නිලධාරීන්	55
86			2025.08.28	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සමන්තුරෙයි	කල්මුණේ	පරිවාස නිලධාරීන් ළමා රක්ෂක ඒකක නිලධාරීන් , ළමා රැදවුම් මධ්‍යස්ථාන නිලධාරීන්	72
87		මානසික සංවර්ධන වැඩසටහන්	2025.09.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය, මාලඹේ	කඩුවෙල	මහජනතාව	69
88	A-7 ආධුනික නීතිඥයින් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සම්බන්ධ වැඩසටහන්	නීති විද්‍යාලයේ ආධුනික නීතිඥයින්විශ්ව / විද්‍යාල සිසුන් (Interns) දැනුවත් කිරීම සහ පුහුණු කිරීම	ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින්			නීති සිසුන්	40
89	A-8 රජයේ නිලධාරීන් හා සාමාන්‍ය ජනතාව නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ නීති සායන	දැනුවත් කිරීම සහ නීති සායන	2025.08.27	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හොරණ	හොරණ	මහජනතාව	59
90			2025.08.28	කාන්තා සංගමයේ දේශන ශාලාව - හම්බන්තොට	හම්බන්තොට	කාන්තාවන්	60
91			2025.11.10	පොලිස් අභ්‍යාස ශ්‍රවණාගාරය	අනුරාධපුරය	පොලිස් නිලධාරීන්	60

92			2025.08.19	කැබිතිගොල්ලෑව ජාතික පාසල	කැබිතිගොල්ලෑව	සිසුන්	161
93			2025.10.16	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	තඹුත්තේගම	ගර්භණී මව්වරුන්	55
94			2025.08.14	පැරණි අධිකරණ සංකීර්ණය - වැලිමඩ	වැලිමඩ	සාමාන්‍ය ජනතාව	62
95			2025.03.15	NH Collection - කොල්ලුපිටිය,	ප්‍රධාන කාර්යාලය	සහයෝගී ආයතන නිලධාරීන් සහ නීති නිලධාරීන්	42
96			2025.09.03	කනන්විල සුගතපාල කනිෂ්ඨ විද්‍යාලය, හොරණ	හොරණ	පාසල් දරුවන්	60
97			2025.09.10	හගැටමාන්න/ විජය ජාතික පාසල	තංගල්ල	දෙමව්පියන්	110
98			2025.10.30	ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය, තෙල්දෙණිය	තෙල්දෙණිය	පොලිස් නිලධාරීන්	52
99			2025.11.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්පාර	අම්පාර	කාන්තාවන්	50
100			2025.05.19	කොළඹ කෞතුකාගාරය	ප්‍රධාන කාර්යාලය	රජයේ නිලධාරීන්	100
101			2025.06.20	රෙජිස්ට්ර් ජෙනරාල් කාර්යාලය	ප්‍රධාන කාර්යාලය	රජයේ නිලධාරීන්	125
102			2025.08.07	රෙජිස්ට්ර් ජෙනරාල් කාර්යාලය	ප්‍රධාන කාර්යාලය	රජයේ නිලධාරීන්	100
103			2025.11.06	මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	මාවනැල්ල	රාජ්‍ය නිලධාරීන්	110
104			2025.08.15	විද්‍යා ප්‍රදීප ශාලාව - වැල්ලවාය	වැල්ලවාය	ප්‍රජා විශෝධන ආඥාලාභීන්	66
105			2025.03.07	මහනුවර රෝයල් මෝල් සම්මන්ත්‍රණ ශාලාව	මහනුවර	රාජ්‍ය නිලධාරීන්	44
106			2025.02.06	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ පිළිබඳ සාකච්ඡාව	මොනරාගල	රජයේ නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්	100

107			2025.02.07	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ පිළිබඳ සාකච්ඡාව	මොනරාගල	රජයේ නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්	100
108			2025.11.08	සිවනේෂන් අනුස්මරණ ශාලාව නැගෙනහිර කරවෙඩ්ඩි	පේදුරුතුඩුව	මහජනතාව	59
109			2025.03.07	කුඹුක්කන ප්‍රජා ශාලාව - නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	මොනරාගල	මහජනතාව	30
110			2025.03.15	NH කලෙක්ෂන් ළමා - ආරක්ෂණ නීතිය	මොනරාගල	නීති නිලධාරීන්	52
111			2025.11.03	කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ළමා කමිටුව	නිකවැරටිය	රජයේ නිලධාරීන්	75
112			2025.10.31	ධාරිතා වර්ධන වැඩසටහන (මාර්ගගත)	ප්‍රධාන කාර්යාලය	නීති නිළධාරීන්	60
113			2025.07.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනපිනුවල	බද්දෙගම	රාජ්‍ය නිලධාරීන්	50
114			2025.09.30	මාදම්පගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ගාල්ල	සමෘද්ධි ප්‍රතිලාභීන්	42
115			2025.10.23	මාතර මානව හිමිකම් කොමිෂන් සභාව	මාතර	පොලිස් නිලධාරීන්, නීති නිලධාරීන්	80
116			09.12.2025	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කැස්බෑව	ප්‍රධාන කාර්යාලය	කාන්තාවන්	80
117			2025.11.26	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෝට්ටේ	බත්තරමුල්ල	රජයේ සේවකයන්	46

1.6.1.C ආරාධිත වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වය

විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ සමාජ සංවිධාන විසින් මෙහය වන වැඩසටහන් වල සම්පත්දායකත්වය ලබා ගැනීම සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත කරනු ලැබ ඇති ආරාධනය මත විවිධ සමාජ සංවිධාන හා ආයතන වල දැනුවත් කිරීමේ වැඩසහටන් වල දේශකයින් වශයෙන් ද, ජංගම සායන වල නීති උපදේශකයින් වශයෙන් ද, වැඩමුළු මෙහෙයවන්නන් වශයෙන් ද, නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරීන්ගේ දායකත්වය ලබා දීම අධිකරණමය රාජකාරි වලට අමතරව සිදු කරනු ලැබූ සුවිශාල මෙහෙවරකි.

නීති ආධාර කොමිෂන් සභාව විසින් ලබා දෙන සේවාවන්, ලිංගික අතවර, මූලික අයිතිවාසිකම්, ළමා අපයෝජන, කාන්තා අයිතිවාසිකම්, ලිංගික කෲරකම්, වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් වූ නීති, මිනිස් ජාවාරම, කම්කරු නීති, ඉඩම් නීති සහ සිවිල් ලේඛන, එදිනෙදා ජීවිතයට අවශ්‍ය සාමාජීය ප්‍රශ්න අලලා වූ නීතිමය තත්ත්ව, පවුල් නීතිය, යුද්ධයෙන් පීඩිත වූ කාන්තාවන්, මුස්ලිම් කාන්තාවන්, විදේශ ගත ශ්‍රමික කාන්තාවන් සඳහා වූ නීතිමය තත්ත්ව හා එදිනෙදා ජීවිතයේදී වැදගත් වන සියළුම නීතින් පාදක කොටගෙන සම්පත්දායකත්ව සැපයීම සිදුකොට ඇත.

2025 වර්ෂයේ නීති ආධාර කොමිෂන් සභාව වෙත ආරාධනා කරන ලදුව සම්පත්දායකත්වය ලබාදෙන ලද නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් **207** කි. එය පහත පරිදි වේ.

ආරාධිත වැඩසටහන්

ක්‍රම සංඛ්‍යාව	පළාත	මධ්‍යස්ථානය	දිනය	ස්ථානය
1	බස්නාහිර	කොළඹ	2025.06.25	අධිකරණ අමාත්‍යාංශය
2			2025.05.29	කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
3			2025.03.15	කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
4			2025.07.23	බත්තරමුල්ල සුහුරුපාය
5			2025.06.19	කොළඹ විශ්ව විද්‍යාලය
6			2025.06.17	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කොළඹ
7			2025.05.29	ටාජ් සමුද්‍රා හෝටලය
8			2025.03.26	රේණුකා සිටි හොටෙල් - කොළඹ
9			2025.05.26	ටාජ් සමුද්‍රා හෝටලය
10			2025.05.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගම්පහ (නීති ආධාර කාර්යාලය ගම්පහ)
11			2025.06.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කඩුවෙල (නීති ආධාර කාර්යාලය කඩුවෙල)
12			2025.07.08	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල (වැලිවිටිය)
13			2025.07.22	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්නපුර (නීති ආධාර කාර්යාලය රත්නපුර)
14			2025.05.14	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අත්තනගල්ල (වේයන්ගොඩ) (නීති ආධාර කාර්යාලය අත්තනගල්ල)
15			2025.05.15	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කලටුවාව
16			2025.07.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දොම්පෙ (නීති ආධාර කාර්යාලය පූගොඩ)
17			2025.07.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නුවරඑළිය (නීති ආධාර කාර්යාලය නුවරඑළිය)
18			2025.07.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඕපනායක (නීති ආධාර කාර්යාලය අවිස්සාවේල්ල)

19			2025.07.13	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාවලපිටිය (නීති ආධාර කාර්යාලය නාවලපිටිය)
20			2025.01.18	NIMH ආයතනය
21		ගම්පහ	2025.05.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
22			2025.08.26	මහජන පුස්තකාල ශ්‍රවණාගාරය
23			2025.10.15	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ
24			2025.12.16	හෙල ඇඳුම් ඇඟලුම් කර්මාන්ත ශාලාව - ගම්පහ
25		හොරණ	2025.03.07	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හොරණ
26			2025.06.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලුතර
27			2025.08.27	ඒ ජී කාර්යාලය හොරණ
28			2025.09.30	වෙනිවැල්පිටිය පාසල
29		හෝමාගම	2025.01.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හෝමාගම
30			2025.06.01	ග්‍රෑන්ඩ් මෝන්ච් හෝටලය, තලවතුගොඩ
31			2025.09.26	ශ්‍රී ලංකා නීතිඥ සංගමය ශ්‍රවණාගාරයේ
32		කඩුවෙල	2025.03.12	ලීනියා මාස් ඇක්ටිව් ඉන්ටිමෝ
33			2025.03.26	මාස් ක්‍රීඩා ආයතනය
34			2025.04.30	බත්තරමුල්ල
35			2025.05.21	ලීනියා ඉන්ටිමෝ ඇක්ටා ආයතනය
36			2025.06.18	සමෘද්ධි දෙපාර්තමේන්තුව
37			2025.06.25	මාස් ඇක්ටිව් ක්‍රීඩා ආයතනය, කඩුවෙල
38			2025.07.28	පරිවාස මූලස්ථානය
39			2025.09.01	ජාතික කාන්තා කමිටුව බත්තරමුල්ල
40			2025.09.02	පරිවාස මූලස්ථානය
41			2025.09.15	මාස් ඉන්ටිමෝ
42			2025.09.17	මාස් ක්‍රීඩා
43			2025.09.24	දැනුවත් කිරීමේ වැඩසටහන සහ නීති සායනය මාලඹේ
44			2025.09.29	දැනුවත් කිරීමේ වැඩසටහන සහ නීති සායනය බත්තරමුල්ල
45		කලුතර	2025.01.30	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලුතර
46			2025.03.27	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලුතර
47			2025.06.30	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , කලුතර
48			2025.08.15	අරලියගහ මන්දිරය
49			2025.09.15	මල්වත්ත බන්ධනාගාරය
50		ගල්කිස්ස	2025.03.21	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දෙහිවල
51		මිනුවන්ගොඩ	2025.03.04	ලීනියා ඇක්ටා ආයතනය
52			2025.09.19	ලීනියා ඇක්ටා ආයතනය
53		මීගමුව	2025.02.11	මීගමුව මහ රෝහල
54			2025.08.26	මීගමු රෝහල
55			2025.09.04	මීගමු රෝහල
56		නුගේගොඩ	2025.01.12	සණස උඩහමුල්ල, ප්‍රජා ශාලාව
57			2025.03.28	මිතුරු පියස, කලුබෝවිල රෝහල (ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දේශන)
58			2025.03.18	මිරිහාන පොලිස් ස්ථානය
59			2025.08.15	අරලියගහ මන්දිරය
60			2025.08.27	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
61		වත්තල	2025.03.14	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
62			2025.03.15	යුනිසෙෆ් ආයතනය
63		අත්තනගල්ල	2025.07.14	සමෘද්ධි බැංකුව - වේයන්ගොඩ
64			2025.07.15	සමෘද්ධි බැංකුව - කලටුවාව

65		පූගොඩ	2025.05.26	ලීනියා ඇක්වා ඇඟලුම් ආයතනය
66			2025.07.09	සමෘද්ධි බැංකුව මාලින්ද
67			2025.08.26	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
68			2025.11.26	ඕවිටිගම මහා විද්‍යාලය
69			2025.12.10	ලීනියා ඇක්වා ආයතනය
70		බත්තරමුල්ල	2025.11.26	කොට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
71			2025.11.15	මද්දුම බණ්ඩාර ප්‍රාථමික විද්‍යාලය - වැලිවේරිය
72		පානදුර	2025.09.17	පානදුර බන්ධනාගාරය
73			2025.09.30	පානදුර මූලික රෝහල
74			2025.09.30	සෙත්සරණ ප්‍රජා ශාලාව
75		බොරැල්ල	2025.08.15	අරලියගහ මන්දිරය
76			2025.09.10	මැන්ඩරිනා හෝටලය
77	දකුණ	බලපිටිය	2025.03.19	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බලපිටිය
78			2025.03.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මඩම්පාගම
79			2025.03.27	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල
80			2025.04.30	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බෙන්තොට
81			2025.06.23	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරන්දෙනිය
82			2025.06.26	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගාල්ල
83			2025.10.08	පළාත් අධ්‍යාපනය
84			2025.10.22	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ශ්‍රවණාගාරයේදී
85			2025.10.29	වැල්ලබඩ නිග්‍රෝධාරාම විහාරය
86			2025.11.19	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණ ශාලාව
87		තංගල්ල	2025.06.25	අගුණුකොළපැලැස්ස බන්ධනාගාරය
88		බද්දෙගම	2025.03.10	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දෙගම
89			2025.04.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගෝනපිනුවල
90			2025.06.26	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , ගාල්ල
91			2025.07.23	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිවිටිය දිවිතුර
92			2025.08.19	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම ෆෙඩරුවත්ත විහාරය
93			2025.08.21	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම කොහොබනදෙණියප්‍රජා ශාලාව
94			2025.08.28	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තෙලිකඩ සණස ශාලාව
95			2025.09.23	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල
96		ගාල්ල	2025.09.24	බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
97			2025.09.30	මාදම්පගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
98			2025.10.02	මදම්පගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
99			2025.11.19	බෙන්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
100		මාතර	2025.07.03	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දොන්ද්‍ර
101			2025.07.08	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැලිපිටිය
102			2025.07.14	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගෝනපිනුවල
103			2025.07.15	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බද්දේගම
104				දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දික්වැල්ල
105				බාඛ්‍රේන්ඩ්‍ර ග්‍රාම
106			2025.07.17	නිලධාරී කාර්යාලය
107			2025.08.12	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කිරින්ද පුහුල්වැල්ල
108			2025.08.27	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාතර

109			2025.08.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අකුරැස්ස
110			2025.09.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගාල්ල
111			2025.09.25	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාතර
112			2025.09.29	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාදම්පගම
113			2025.11.10	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාලිම්බඩ
114			2025.12.10	මිනිසුන්ට අදාළ නීතිය
115			2025.12.12	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දෝන්ද්‍ර
116			2025.12.16	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාලිම්බඩ
117	මධ්‍යම	හැටන්	2025.01.16	ප්‍රාදේශීය සභාව, නෝර්වුඩ්
118			2025.01.17	ප්‍රාදේශීය සභාව, ගිනිගත්හේන
119			2025.02.13	ප්‍රාදේශීය සභාව, ගිනිගත්හේන
120			2025.03.11	ලා ඇඩම්ස් හෝටලය, හැටන්
121			2025.05.27	ප්‍රාදේශීය සභාව, නෝර්වුඩ්
122			2025.05.28	ප්‍රාදේශීය සභාව, ගිනිගත්හේන
123			7/25/2025	LA ඇඩම්ස් හෝටලය, හැටන්. මානව හිමිකම් කොමිසම
124			8/18/2025	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නොර්වුඩ්
125			9/4/2025	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගිනිගත්හේන
126			9/15/2025	නගර සභාව, හැටන්
127			9/24/2025	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගිනිගත්හේන
128		නුවරඑළිය	2025.03.25 & 26	Equite සංවිධානය - LGBTIQ අයිතිවාසිකම් වැඩසටහනේ රජයේ කොටස්කරුවන්
129			2025.03.10	සේවා සපයන්නන් ඕ සොගිස්ක් LGBTQ
130			2025.09.20	මහගස්තොට වතුයාය
131		ගලගෙදර	2025.03.10	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පූජාපිටිය
132			2025.09.10	AGA කාර්යාලීය ශ්‍රවණාගාරය පූජාපිටිය
133			2025.09.16	AGA කාර්යාලීය ශ්‍රවණාගාරය පූජාපිටිය
134			2025.11.19	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ශ්‍රවණාගාරය - පූජාපිටිය
135			2025.11.25	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ශ්‍රවණාගාරය - ගලගෙදර
136		නාවලපිටිය	2025.06.13	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නාවලපිටිය පස්බාගේ කෝරලේ
137			2025.09.01	නවලපිටිය AG කාර්යාලය
138		තෙල්දෙණිය	2025.05.22	BOI පල්ලේකැලේ
139			2025.06.16	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පාතදුම්බර
140	උතුරු මැද	අනුරාධපුරය	2025.02.11	බන්ධනාගාරය - අනුරාධපුර
141			2025.02.28	ක්‍රිස්ටර්න් පාර්ක් හෝටලය
142			2025.03.11	රජරට විශ්වවිද්‍යාලය
143			2025.10.08	DS/NCP
144			2025.11.21	DS/NCP
145			2025.11.26	දිස්ත්‍රික් කාර්යාලය
146		කැකිරාව	2025.03.26	සමෘද්ධි බැංකුව, කැකිරාව
147			2025.03.27	සමෘද්ධි බැංකුව, විජිතපුර
148		පොළොන්නරුව	2025.01.20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තමන්කඩුව
149			2025.02.28	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොළොන්නරුව
150			2025.08.22	පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
151			2025.09.15	තෘතීය හා වෘත්තීය පු.ම
152			2025.09.19	වැලිකන්ද ප්‍රා.ලේ
153		නිගුරක්ගොඩ	2025.06.23	පො/මණ්ඩලගිරිය මහා විද්‍යාලය, මැදිරිගිරිය

154			2025.06.23	මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
155			2025.07.08	පොර/රජරට විද්‍යාලය - හිඟුරක්ගොඩ
156			2025.09.15	හිඟුරක්ගොඩ ප්‍රදේශීය සභාව
157			2025.09.16	ගිරිතලේ ජනපදය - මරණාධාර සමිති ශ්‍රවණාගාරය
158		බලංගොඩ	2025.03.05	මාස් ඇක්ටිව් ක්‍රීඩා, බලංගොඩ
159			2025.06.09	මාස් ඇක්ටිව් ක්‍රීඩා ආයතනය, බලංගොඩ
160			2025.07.24	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඕපනායක
161			2025.10.22	මාස් ඇක්ටිව් ක්‍රීඩා බලංගොඩ
162		වරකාපොල	2025.03.05	මාස් ආයතනය, මහනුවර
163			2025.03.20	මාස් ආයතනය, තුල්හිරිය
164			2025.03.27	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෑගල්ල
165			2025.07.02	මාස් තුරුලිය ආයතනය - තුල්හිරිය
166	සබරගමුව		2025.09.19	මාස් තුරුලිය ආයතනය - තුල්හිරිය
167			2025.10.30	පොලිස් ස්ථානය වරකාපොල
168			2025.11.21	උසස් තාක්ෂණ ආයතනය කෑගල්ල
169			2025.11.21	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෑගල්ල
170			2025.12.08	මාස් මැක්ලියා - තුල්හිරිය
171		රත්නපුර	2025.06.25	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පැල්මඩුල්ල
172			2025.07.22	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
173		දෙයියන්දර	2025.10.30	ගොම්බද්දල සේවා පියස
174		ඇඹිලිපිටිය	2025.12.15	MAS ඇක්ටිවා ඒසියා ලයින් තෝර කොලයාය
175		මහව	2025.01.29	අඹන්පොල
176		නිකවැරටිය	2025.02.07	නික/වන්නිනායක මධ්‍ය විද්‍යාලය
177	වයඹ		2025.10.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොටවෙහෙර
178		පොල්ගහවෙල	2025.03.12	සමෘද්ධි බැංකුව, රත්මල්ගොඩ
179			2025.03.17	මාස් ෆැබ්රික්ස්, තුල්හිරිය
180		අම්පාර	2025.01.16	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දමන
181			2025.03.11	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්පාර
182			2025.10.10	අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
183	නැගෙනහිර	මුතූර්	2025.02.21	පර්ල් ග්‍රෑන්ඩ් හෝටලය - මුතූර්
184		කන්තලේ	2025.09.30	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කන්තලේ
185		පොතුවිල්	2025.07.30	මාර්ග සංවර්ධන ගොඩනැගිල්ල පොතුවිල් 06
186		මුලතිවු	2025.03.05	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුදුකුඩුඉරිප්පු
187			2025.0312	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ඔඩ්ඩුසුඩාන්
188			2025.06.23	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඔඩ්ඩුසුඩාන්
189			2025.09.10	ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
190			2025.09.17	මුලතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
191			2025.09.26	මුලතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
192		කිලිනොච්චි	2025.03.10	අන්නයිරවු
193			2025.03.11	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
194			2025.03.21	සමූපකාර ශාලාව
195	උතුර		2025.03.24	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පූනගරි
196		පේදුරුතුඩුව	2025.03.11	මහජන පුස්තකාලය, යාපනය
197			2025.03.18	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කරවෙඩ්ඩි
198			2025.04.21	ප්‍රධාන කාර්යාලය
199			2025.06.18	ස්ටාර් හෝටලය කිලිනොච්චි
200		බදුල්ල	2025.01.23	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බදුල්ල
201	ඌව		2025.06.12	ඔරික්ස් හෝටලය
202		මහියංගණය	2025.12.22	ගැමුණුපුර ෂේඩ් ලයින් ආයතනය

203		සියඹලාණ්ඩුව	2025.10.09	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සියඹලාණ්ඩුව
204		මොණරාගල	2025.10.17	පැවිලියන් හෝටලය, මොණරාගල
205			2025.10.19 - 2025.11.01	JICA ජපන්
206			2025.11.18	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
207		වැල්ලවාය	2025.08.15	විද්‍යා ප්‍රදීප ශාලාව

1.6.2 අපරාධ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය ලමා ආරක්ෂණ අධිකාරිය හා මානව හිමිකම් කොමිෂන් සභාව සමග සිදු කරනු ලද වැඩසටහන්

අපරාධ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය ලමා ආරක්ෂණ අධිකාරිය හා මානව හිමිකම් කොමිෂන් සභාව සහ අනෙකුත් නීති ආධාර සපයන ආයතන වෙත ලැබෙන පැමිණිළිවලට අදාල අපරාධ නඩුවල වින්දිතයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ද වින්දිත දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ද මූලික අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයින් වෙනුවෙන්ද අධිකරණයන්හි පෙනී සිටීමට නීති ආධාර කොමිෂන් සභාවේ දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන මඟින් නීති නියෝජනය ලබා දීම සිදු කරයි. මෙය ආයතන අතර සම්බන්ධීකරණයෙන් සිදුවේ.

1.6.3 JURE ව්‍යාපෘතිය අනුග්‍රහයෙන් කරනු ලබන වැඩසටහන්

නීති ආධාර කොමිෂන් සභාව විදේශීය අරමුදල් මඟින් පවත්වන ව්‍යාපෘති අතර 2025 වසරේ ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ද සහය ඇතිව පවත්වන යුක්තිය සඳහා සහාය ව්‍යාපෘතිය (JURE) මඟින් නීති ආධාර සායන 27 ක් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක පවත්වන ලදී. මෙම ව්‍යාපෘතියට මූල්‍ය අනුග්‍රහය ලබා දෙනුයේ යුරෝපියානු සංගමය විසිනි. මීට අමතරව ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය (National Legal Aid Policy) නැවත විශ්ලේෂණය කිරීම හා සංවිධානය කිරීම පිලිබඳ කතිකාවත සිදු කිරීම හා සංශෝධනය වෙමින් පවතින ජාතික නීති ආධාර ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩල අනුමැතිය දක්වා යොමු කරවන ක්‍රියාවලිය සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ දත්ත පරිපාලනය කිරීම සඳහා ක්‍රමවේදයන් ද (Data Mangement System) සකස් වෙමින් පවතින අතර ප්‍රාදේශීය නීතිඥ සංගම් වල කනිෂ්ඨ නීතිඥ සහාය නීති ආධාර කොමිෂන් සභාවේ නඩු කටයුතු සඳහා ලබා ගැනීමට ද මෙම ව්‍යාපෘතිය හරහා ක්‍රමවේදයක් සකස් කිරීම 2025 වසරේදී ආරම්භ කර තවදුරටත් කටයුතු සිදු වෙමින් පවතී.

- ආන්තික ප්‍රජාවන් සඳහා නීති ආධාර සපයන අනෙකුත් සංවිධාන සමග අදහස් හුවමාරු කර ගැනීමේ සැසි පැවැත්වීම මඟින් නීති ආධාර සපයන දිවයිනේ අනෙකුත් ආයතන සමඟ අන්තර් සබඳතාවයන් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීම තුළින් නීති ආධාර සැපයීමේ සේවාව තව දුරටත් ශක්තිමත් වීම සිදු වේ.

- JURE ව්‍යාපෘතියට සමගාමී වැඩසටහන් දියත් කිරීම.

අනු අංකය	මධ්‍යස්ථානය	සායනය පිහිටි ස්ථානය (ස්ථානය/ලිපිනය)	දිනය	ඉලක්කගත ප්‍රජාව
1	මඩකලපුව	මඩකලපුව - බන්ධනාගාරය	2025.09.17	සිරකරුවන්
2	පොළොන්නරුව	වැලිකන්ද දිස්ත්‍රික් කාර්යාලය	19.09.2025	ආබාධ සහිත පුද්ගලයින්
3	අනුරාධපුරය	අනුරාධපුරය - බන්ධනාගාරය	2025.09.23	සිරකරුවන්
4	මොණරාගල	දිස්ත්‍රික් කාර්යාලය	26.09.2025	වැඩිහිටියන්
5	දෙහිඅත්තකණ්ඩිය	දිස්ත්‍රික් කාර්යාලය පදියතලාව	10.10.2025	පදියතලාව යෞවනයන්
6	සියබලාණ්ඩුව	බුද්ධ රාජමහා විහාරස්ථානය, බුද්ධම	03.10.2025	සාමාන්‍ය ජනතාව
7	බණ්ඩාරවෙල	යශෝදරා ප්‍රජා ශාලාව	10.10.2025	සාමාන්‍ය ජනතාව
8	වැලිමඩ	යාල්පත්වෙල ප්‍රජා ශාලාව, වැලිමඩ	25.10.2025	සාමාන්‍ය ජනතාව
9	කැකිරාව	තෙලිංගු ධීවර ගම්මානය	10.10.2025	තෙලිංගු ධීවර ප්‍රජාව
10	කැබිතිගොල්ලෑව	කැබිතිගොල්ලෑව ධර්මාරාම විහාරස්ථානය	12.12.2025	සිවිල් ආරක්ෂක බළකායේ පිරිස්

11	තඹුත්තේගම	ප්‍රජා විශෝධන ආඥාලාභීන්ට	2025.11.06	ප්‍රජා විශෝධන ආඥාලාභීන්
12	මහියංගනය	මාස් ක්‍රීඩා ෂේඩ්ලයින්	27.10.2025	නිදහස් වෙළඳ සේවකයින්
13	හිඟුරක්ගොඩ	බන්ධනාගාරය - පොළොන්නරුව	09.10.2025	සිරකරුවන්
14	බදුල්ල	බන්ධනාගාරය - බදුල්ල	18.10.2025	සිරකරුවන්
15	කල්මුනේ	ප්‍රජා සායනය	15.10.2025	ජංගම සායනය
16	හොරණ	කළුතර බන්ධනාගාරය	07.12.2025	සිරකරුවන්
17	ප්‍රධාන කාර්යාලය	කොළඹ බන්ධනාගාරය	05.12.2025	රක්ෂිත බන්ධනාගාර ගත කරන්නන්
18	කළුතර	බදුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	08.12.2025	සාමාන්‍ය ජනතාව
19	මාතර	මාතර බන්ධනාගාරය	05.12.2025	සිරකරුවන්
20	ප්‍රධාන කාර්යාලය	සමෘද්ධි බැංකු ශ්‍රවණාගාරය	10.12.2025	සමෘද්ධිලාභීන්
21	හම්බන්තොට	අගුණුකොළපැලැස්ස බන්ධනාගාරය	10.12.2025	සිරකරුවන්
22	ප්‍රධාන කාර්යාලය	හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	13.12.2025 Tentative	සමෘද්ධිලාභීන්
23	ප්‍රධාන කාර්යාලය	වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	14.12.2025 Tentative	සමෘද්ධිලාභීන්
24	ප්‍රධාන කාර්යාලය	කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	09.12.2025	කාන්තාවන්
25	ප්‍රධාන කාර්යාලය	ප්‍රජා මධ්‍යස්ථානය - මට්ටක්කුලිය	12.12.2025	ගංවතුරෙන් පීඩාවට පත් පුද්ගලයින්
26	ගාල්ල	ගාල්ල බන්ධනාගාරය	01.12.2025	සිරකරුවන්
27	පොළොන්නරුව	පොළොන්නරුව බන්ධනාගාරය	11.12.2025	සිරකරුවන්

JURE ව්‍යාපෘතිය යටතේ දරුවන් සමඟ කටයුතු සිදු කිරීම

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සහ UNICEF සංවිධානය සමඟ ළමයින්ගේ නඩු කටයුතු වලදී නීති ආධාර කොමිෂන් සභාවේ භූමිකාව සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරීමට සාකච්ඡා කරමින් පවතින අතර යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ ළමයින් සම්බන්ධිත නඩු කටයුතු සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් සකස් කිරීමත් අධිකරණයට නව ක්‍රමවේදයක් සකසමින් දරුවකු අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දීම දරුවාට හිතකර ලෙස කෙසේ සිදු කරන්නේ ද Child friendly legal aid යන්න පිළිබඳව යුනිසෙෆ් (UNICEF) අනුග්‍රහයෙන් සාකච්ඡා මාලාවක් පවත්වන ලදි.

1.6.4 JICA Knowledge Co-Creation Program – SDG 16 සඳහා නීති ප්‍රවේශය වර්ධනය කිරීම

උක්ත තේමාව යටතේ Japan International Cooperation Agency (JICA) විසින් සංවිධානය කරන ලද "Improving Access to Justice to Realize SDG 16" (Course No: 202.11 1475J001) තාක්ෂණික පුහුණු වැඩසටහන 2025 ඔක්තෝබර් 19 සිට නොවැම්බර් 01 දක්වා ජපානයේ දී පැවැත්විණි. මෙම වැඩසටහනේ අරමුණ වූයේ සමාජයේ සියලු ජනතාවට සාධාරණ හා සමාන නීති ප්‍රවේශයක් සපයමින් SDG 16 (Peace, Justice and Strong Institutions) අරමුණ සාර්ථක කරගැනීම සඳහා රටවල් අතර දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමයි. ඒ සඳහා විවිධ රටවල් නීති ආධාර හා අධිකරණ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පුහුණුලාභීන් 11 දෙනකු පමණ සහභාගී විය.

මෙම පුහුණු වැඩසටහන දේශන, වාර්තා ඉදිරිපත් කිරීම්, කණ්ඩායම් සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ සංචාර සහ අධිකරණ නිරීක්ෂණ සංචාර ඇතුළත් විය. ජපානයේ අපරාධ නීති ආධාර පද්ධතිය සහ සිවිල් නීති ආධාර ක්‍රමවේද පිළිබඳ විස්තරාත්මක දේශන පවත්වන ලදී. එහිදී Japan Federation of Bar Associations (JFBA) විසින් ක්‍රියාත්මක කරන අධිකරණ පත් කළ නීතිඥ මණ්ඩල, නීති ආධාර ලබාදීමේ ප්‍රතිපත්ති සහ නීති සේවා පුළුල් කිරීමේ ක්‍රමවේද විස්තර කෙරිණි.

තවද Japan Legal Support Center (JLSC) හි කාර්යභාරය, නීති සමාජ සේවා (Judicial Social Work) සංකල්පය, දුරස්ථ ප්‍රදේශවල නීති සේවා ලබාදීමේ විශේෂ ක්‍රමවේද සහ නගර පාලන ආයතන හා සමාජ සේවා ආයතන සමඟ සම්බන්ධීකරණය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබාගැනීමට හැකි විය.

Tokyo දිස්ත්‍රික් අධිකරණයට සහ Ministry of Justice Japan වෙත සිදුකළ සංචාර මඟින් ජපානයේ නීති පද්ධතියේ ප්‍රතිපත්තිමය හා පරිපාලනමය සම්බන්ධීකරණය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකි විය.

Aomori, Kazuno සහ Sendai ප්‍රදේශවල ක්ෂේත්‍ර සංචාර තුළින් දුරස්ථ හා නීති සේවා සීමිත ප්‍රදේශවල නීති ප්‍රවේශය ශක්තිමත් කිරීමේ උත්සාහයන් අධ්‍යයනය කරන ලදී. විශේෂයෙන් Sendai නගරයේ භූකම්පන පසුකාලීන නීති ආධාර වැඩසටහන් මඟින් ආපදා අවස්ථාවලදී නීති ආධාර ආයතන ඉටුකරන භූමිකාව පිළිබඳ වැදගත් අත්දැකීම් ලබාගැනීමට හැකි විය. JLSC Call Center ක්‍රමය මඟින් දුරකථන හරහා නීති උපදෙස් හා මඟපෙන්වීම් ලබාදීමේ ක්‍රමවේද ද හඳුනාගන්නා ලදී.

වැඩසටහනේ අවසන් අදියරේ කණ්ඩායම් සාකච්ඡා හා ක්‍රියාකාරී සැලසුම් (Action Plan) සකස් කිරීම සිදුකෙරුණි. එමඟින් තම රට තුළ නීති ආධාර පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට සහ ජාත්‍යන්තර වශයෙන් හොඳම භාවිතයන් ඇතුළත් කිරීමට අවස්ථාව ලැබුණි.

මෙම පුහුණුව මඟින් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යභාරය ජාතික අවශ්‍යතා සමඟ තුළනය කරමින් ප්‍රාදේශීය මට්ටමින් නීති සේවා පුළුල් කිරීම සහ පහසුකම් වැඩිදියුණු කිරීම, නීති ආධාර සහ සමාජ වැඩ සේවා සංකල්පය හඳුන්වාදීම සහ ආයතනික ශක්තිය වර්ධනය කිරීම සඳහා වැදගත් දැනුම හා අත්දැකීම් ලබාගැනීමට හැකි විය. එමඟින් SDG 16 අරමුණට අනුකූලව සාධාරණ හා ප්‍රවේශය පහසු නීති පද්ධතියක් ගොඩනැගීමට දායක වීමට මෙය උපකාරී වේ.

පරිපාලන අංශය



2.2පරිපාලන අංශය

2.1 යටිතල පහසුකම්

2.1.1කාර්යාල උපකරණ

නීති ආධාර සේවාවන් පහසුවෙන් සහ කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අත්‍යාවශ්‍ය පොත්පත්, ලිපි ලේඛණ, කාර්යාලීය උපකරණ, පරිගණක උපාංග මෙන් ම ඡායාපිටපත් යන්ත්‍ර ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම . ප්‍රමාණවත් ඉඩ පහසුකම් සෑම මධ්‍යස්ථානයකටම සමානව නොමැති වීම සහ පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීමේ ගැටළුව තවදුරටත් පවතී .

පවතින සීමිත පහසුකම් යටතේ නීති ආධාර මධ්‍යස්ථාන සඳහා ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර පහත භාණ්ඩ 2025 වර්ෂය තුළ දී ලබා දී ඇත.

අනු අංකය	උපකරණ	මධ්‍යස්ථාන ගණන
01	ලී බඩු සහ උපකරණ මිලදී ගැනීම්	22
02	රවුටර්, Pen Drive,පරිගණක උපාංග,ඡායා පිටපත් යන්ත්‍ර,ඇතුලු අනෙකුත් කාර්යාල උපකරණ මිලදී ගැනීම්	38
03	මුද්‍රණ පහසුකම්	ප්‍රධාන කාර්යාලය
04	ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම්	ප්‍රධාන කාර්යාලය
05	තීන්ත ආදි කාර්යාලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම්	17
06	වාහන අලුත් වැඩියා කිරීම් (KA- 6941, KP-1153)	ප්‍රධාන කාර්යාලය
07	ලේඛන ආරක්ෂාව උදෙසා කෘමි උවදුරු පාලනය	ප්‍රධාන කාර්යාලය
08	වාහන රක්ෂණ පහසුකම්	ප්‍රධාන කාර්යාලය
09	පරිගණක මෘදුකාංග ඇතුලු උපකරණ	16

.21.2 ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය

පොළොන්නරුවමිනුවන්ගොඩ සහ බලපිටිය යන මධ්‍යස්ථාන වල ප්‍රතිසංස්කරණ කටයුතු ඉල්ලීම් ,අම්පාර , කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ අතර ඊට අදාල අලුත්වැඩියා කිරීම සම්බන්ධ කටයුතු සඳහා අධිකරණ .සහ ජාතික ඒකාබද්ධතා කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත

2.1.3 ව්‍යුහාත්මක වෙනස් කම් සිදු කිරීම්

රජයට අයත් වාණිජ මය නොවන ආයතන සමාලෝචනය පිළිබඳ අංක අමප205/802/0288/25/ හා 17/3/2025 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ව්‍යුහාත්මක වෙනස්කම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට අධිකරණ අමාත්‍යාංශය හා එක්ව කමිටුවක් පත්කළ අතර ඊට අදාල සිදුකළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ වාර්තාව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

2.1.4 ප්‍රාදේශීය මධ්‍යස්ථාන නිරීක්ෂණය

2025 වසරේදී ද ප්‍රාදේශීය කාර්යාල නිරීක්ෂණය කිරීම සහ ඒවායේ ගැටළු අඩුපාඩු හඳුනාගෙන ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම පසුවිපරම් සිදුකිරීමද ක්‍රමානුකූලව සිදුකරන ලදීමෙමගින් නීති ආධාර මධ්‍යස්ථාන ජාලය වඩාත් . .කාර්යක්ෂමව පවත්වාගෙන යාම සහ මනා සම්බන්ධීකරණයක් තුළින් පවත්වාගෙන යාම මේ හරහා සිදුවිය වසර තුළ සිදුකරන ලද කේෂේත්‍ර නිරීක්ෂණයන්ට අදාල මධ්‍යස්ථාන 2025පහත පරිදි වේ.

අනු අංකය	පළාත	මධ්‍යස්ථානය
01	වයඹ	වාරියපොළ පුත්තලම නිකවැරටිය
02	සබරගමුව	රත්නපුර බලංගොඩ
03	ඌව	බදුල්ල
04	බස්නාහිර	මතුගම කලුතර පානදුර මීගමුව මිනුවන්ගොඩ අවිස්සාවේල්ල අත්තනගල්ල බත්තරමුල්ල බොරැල්ල කඩුවෙල කඩවත වත්තල
05	දකුණ	ගාල්ල මාතර

2.1.5 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් - විදේශීය

දිනය	තනතුර	නිලධාරීන් සංඛ්‍යාව	විදේශ පුහුණුව ලැබූ රට සහ ආයතනය
2025.10.19 සිට 2025.11.01 දක්වා	අධ්‍යක්ෂ ජනරාල්	01	ජපානය (JICA)
	නීති නිලධාරී	01	

2.1.6 කාර්ය මණ්ඩල පුහුණු කිරීම්- දේශීය

අංකය	දිනය	පුහුණු පාඨමාලාව	තනතුර
01	20250.7.29 දින සිට දින 10	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	කළමණාකරණ සහකාර

2.1.7 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

දිනය	නතතුරු	පරීක්ෂණය සඳහා යොමු වූ ගණන
2025.06.14	කළමණාකරණ සහකාර (තාක්ෂණික නොවන)	66
2025.07.04	ගිණුම් නිලධාරී	01
	පරිපාලන නිලධාරී	01
	කළමණාකරණ සහකාර (තාක්ෂණික)	03

2.1.8 දෙවන කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය අනුව පශ්චාත් උපාධි අයදුම් කිරීම

තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්	02
නීති නිලධාරී	01

2.1.9 නව බඳවා ගැනීම්

2025 වර්ෂය තුළ නීති ආධාර කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබූ නව බඳවා ගැනීම් පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
01	අධ්‍යක්ෂ ජනරාල්	01
02	නීති නිලධාරී	20
04	කළමනාකරන සහකාර තාක්ෂණික) නොවන(	කළමනාකරණ සහකාර අයදුම්පත් (තාක්ෂනික නොවන) 3000කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබූ අතර ඒවා බඳවා ගැනීම් පටිපාටියට අනුව තෝරාගැනීම් කටයුතු කර සම්මුඛ වර්ෂයේ පරීක්ෂණ2025 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන් තුළ පවත්වන ලද අතර වර්ෂයේ මුල සිට 2026 බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.
05	සංවර්ධන නිලධාරීන් අනියුක්ත කිරීම්	01
මුළු එකතුව		22

2.1.10 ස්ථාන මාරු කිරීම්

තනතුර	නිලධාරීන් ගණන
නීති නිලධාරී	04
කාර්යාල කාර්ය සහකාර	01

මූලාශ්‍ය

2025

ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. වාර්තාකරණ ආයතනය

1.1 නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් ස්ථාපිත කරන ලදි. යුක්තියේ පිළිසරණ ලබා ගැනීමට නොහැකි ශ්‍රී ලාංකික ජන කොටස් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට නොමිලේ නීති උපදෙස් සහ නීතිඥ සහාය ලබාදීම, සමස්ත සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීම, යනාදිය මෙහි කාර්යභාරයන් වේ. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින අතර, එහි ලියාපදිංචි කාර්යාලය අංක 128, මහාධිකරණ සංකීර්ණය, කොළඹ 12 යන ස්ථානයේ පිහිටා ඇත

1.2. මූල්‍ය කාලපරිච්ඡේදය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මූල්‍ය කාලපරිච්ඡේදය, ලිත් මාස දොළහක කාලපරිච්ඡේදයක් නියෝජනය කරයි.

1.3. මෙම ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය පහත පරිදි වේ.,

- නෛතික සහාය ලබා දීම
- නීති උපදෙස් ලබා දීම
- නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- නීති පර්යේෂණ සිදු කිරීම

2. සකස් කිරීමේ පදනම

2.1 නීති ආධාර කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට (SLPSAS) අනුකූලව පිළියෙල කර ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලින් (SLPSAS) ආවරණය නොවන ක්ෂේත්‍ර සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතද අනුගමනය කරනු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ඒවාට අදාළ සටහන් වලින් සමන්විත වේ.

2.1. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

කොමිෂන් සභාවේ සාමාජිකයින් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වන ඔවුන්ගේ වගකීම පිළිගනු ලබයි. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු ඒවායේ යම්කිසි සංශෝධනයක් කිරීමේ බලය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

මූල්‍ය ප්‍රකාශන, නීති ආධාර කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමත කරනු ලදුව 2026.02.24 දින නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

2.3. මිනුම් පදනම

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.4. සංසදනාත්මක තොරතුරු

ප්‍රවර්ථන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ සැසඳීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම මුදල් ප්‍රමාණයන්ට අදාළව, පූර්ව කාලපරිච්ඡේදයට අදාළ ප්‍රමාණාත්මක, විස්තරාත්මක සහ ආඛ්‍යානමය තොරතුරු ඇතුළත් සැසඳීමේ තොරතුරු අනාවරණය කර ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස, වත්මන් වර්ෂයේ වර්ගීකරණයට අනුකූල වන පරිදි, අවශ්‍ය සෑම අවස්ථාවකදීම සැසඳීමේ තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

2.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 02ට / SLPSAS 02 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) අනුකූලව වක්‍ර ක්‍රමය (Indirect Method) භාවිතයෙන් පිළියෙල කර ඇති අතර, ඒ මගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත.

2.6. සුවිශේෂී ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තාගත ප්‍රමාණයන්ට බලපාන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරිත්වය විසින් සිදු කර ඇත.

සැබෑ ප්‍රතිඵල එම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන, එම ඇස්තමේන්තුව සංශෝධනය කරන කාලපරිච්ඡේදය තුළදී සහ ඉන් බලපෑමක් ඇති වන ඉදිරි ඕනෑම කාලපරිච්ඡේදයකදී හඳුනාගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදල් ප්‍රමාණයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්, කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ භාවිතා කරන ලද ප්‍රතිපත්ති සමඟ අනුකූල වේවත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි ., පූර්ව වර්ෂයේ සංඛ්‍යා ලේඛන සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය සෑම අවස්ථාවකදීම නැවත සකස් කර ඇත.

3.2 අඛණ්ඩ පැවැත්ම

ලබාගත හැකි තොරතුරු මත පදනම්ව 2025.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම තීරණය කිරීමේදී, කළමනාකාරිත්වය විසින් කොමිෂන් සභාවේ පැවැත්ම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීමේ උචිතභාවය ඇගයීමට ලක් කර ඇත.

3.3. දේපළ, පිරියත සහ උපකරණ

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (LAC) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය පදනම මත වාර්තා කර ඇත . පිරිවැයඑතිහාසික පිරිවැය පදනම මගින් දක්වනු ලැබේ.

3.3.1 හඳුනාගැනීමේ පදනම

දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයෙන් ක්ෂයවීම් අඩු කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇතදේපළ ., පිරියත සහ උපකරණවල පිරිවැය යනු ප්‍රත්‍යාගණනය කරන ලද අගය හෝ අනුෂංගික වියදම් ඇතුළත් මිලදී ගැනීමේ පිරිවැයයි.

3.4. ක්ෂයවීම්

3.4.1. මිනුම් පදනම

ක්ෂය ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය මත සරල මාර්ග ක්‍රමය (Straight-line Method) භාවිතයෙන්, එම මුදල් ප්‍රමාණයන් ඒවායේ ජීව කාලය තුළ සමාන වාරික වලින් කපා හැරීම සඳහාය. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් වැදගත් කොටස සඳහා ක්ෂය කිරීම් ගාස්තු වෙන වෙනම තීරණය කරනු ලබන අතර, එය භාවිතය සඳහා පවතින අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ වේ. සින්නක්කර ඉඩම් (Freehold Land) සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු නොලැබේ.

3.4.2. ක්ෂය

වත්කම තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව පිළිබිඹු කරමින්, දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක ඇස්තමේන්තුගත උපයෝගීතා කාලය තුළ සරල මාර්ග පදනමක් මත ක්ෂයවීම් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

ගොඩනැගිලි	10%
පිරියත සහ යන්ත්‍ර සූත්‍ර:	10%
ගෘහ භාණ්ඩ, සවි කිරීම්, මෘදු ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	10%
පරිගණක, මුද්‍රණ යන්ත්‍ර , ජංගම දුරකථන සහ ලැප්ටොප්	25%
පොත්පත්	10%
මෝටර් රථ	20%

3.4.3. ප්‍රති හඳුනාගැනීම

ප්‍රත්‍යාගණනය කිරීමේ ආකෘතිය

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි බව ස්ථීර නම් පමණක්, එම අයිතමයේ ධාරණ අගය (Carrying Amount) තුළ හඳුනාගනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ අගය හඳුනාගැනීමෙන් ඉවත් කරනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය, ඒවා දරනු ලබන වර්ෂයේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

කොමිෂන් සභාව සිය දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කරන අතර, ඒවා ප්‍රත්‍යාගණනය කරන දිනයේ සාධාරණ අගයෙන්, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණයන් අඩු කර මනිනු ලැබේ. වාර්තාකරණ දිනයේදී වත්කමක ධාරණ අගය, සාධාරණ අගය භාවිතයෙන් තීරණය කරනු ලබන අගයෙන් සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් නිරන්තරතාවයකින් යුතුව ප්‍රත්‍යාගණනයන් සිදු කරනු ලැබේ.

3.5 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුළ දරන ලද, ශේෂ පත්‍ර දිනය වන විට ප්‍රාග්ධනීකරණය කර නොමැති ප්‍රාග්ධන වියදම් ‘දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන්’ ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය කර භාවිතයට ගන්නා ලද ප්‍රාග්ධන වත්කම් ‘දේපළ, පිරියත සහ උපකරණ’ ගිණුමට මාරු කර ඇත.

3.6 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්, ආරම්භක හඳුනාගැනීමේදී පිරිවැය මත මනිනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්‍රෂය (Amortization) සහ සමුච්චිත හානිකරණයන් (තිබේ නම්)ඒවා අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය හැර, අභ්‍යන්තරව උත්පාදනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය නොකරන අතර, එම වියදම් දරනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ පිළිබිඹු වේ. කොමිෂන් සභාවේ අස්පෘශ්‍ය වත්කම්, ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික කාලය තුළ පිරිවැය කපා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්‍රෂයකරනු ලැබේ.

3.7 තොග

නඩත්තු ද්‍රව්‍ය, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සහ ලිපිද්‍රව්‍ය තොග ආදියෙන් තොග සමන්විත වේ. සේවාලාභීන් වෙත සේවා සැපයීම සඳහා භාවිතයට ගන්නා පරිභෝජන ද්‍රව්‍ය ලෙස තොග ප්‍රකාශ කර ඇත. තොග, බරිත සාමාන්‍ය පිරිවැය පදනම (Weighted Average Cost Basis) මත ප්‍රකාශ කර ඇත.

3.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දේවලට අතැති මුදල් සහ බැංකු තැන්පතු මෙන්ම, මුල් කල් පිරීමේ කාලය මාස 03 ක් හෝ ඊට අඩු වෙනත් කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන ඇතුළත් වේ.

3.9 වගකීම් සහ ප්‍රතිපාදන

3.9.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

3.9.1 පළමු සේවා වර්ෂයේ සිට ආරම්භ වන පරිදි, සම්පූර්ණ කරන ලද සෑම සේවා වර්ෂයක් සඳහාම සියලුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ මාසයක වැටුපෙන් අඩකට සමාන මුදලක් මත ගණනය කරන ලද විශ්‍රාම පාරිතෝෂික (Gratuities) සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සේවකයෙකු සඳහා වන වගකීම පැනනගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

3.9.2 නිර්වචනය කරන ලද දායකත්ව සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF)

කොමිෂන් සභාව, සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා අදාළ රෙගුලාසිවලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් දායක වේසේවකයින් ආවරණය වන පරිදි අරමුදල් සඳහ .ා වන දායකත්ව බැඳීම් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ

සේවක අර්ථසාධක අරමුදල (EPF):

මූලික වැටුප + ජීවන වියදම් දීමනාව + වෘත්තීය දීමනාව යන එකතුව මත සංස්ථාව සහ සේවකයින් පිළිවෙලින් 12% ක් සහ 8% ක් අර්ථසාධක අරමුදල සඳහා දායක කරති.

සේවක භාරකාර අරමුදල (ETF):

මූලික වැටුප + ජීවන වියදම් දීමනාව + වෘත්තීය දීමනාව යන එකතුව මත අධිකාරිය විසින් 3% ක් සේවක භාරකාර අරමුදල වෙත දායක කරනු ලබයි.

3.10.1 රජයේ ප්‍රධාන

3.10.2 පුනරාවර්තන ප්‍රධාන

රජයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රධාන, නීති ආධාර කොමිෂන් සභාවේ (LAC) ආදායම් මාර්ගය ලෙස ආදායම් ප්‍රකාශය තුළ පිළිබිඹු වේ.

3.10.3 ප්‍රාග්ධන ප්‍රධාන / අග්‍රිම

රජයෙන් මුදලින් සහ ද්‍රව්‍යමය වශයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රධාන / අග්‍රිම වේ. ප්‍රාග්ධන ප්‍රධාන / අග්‍රිම අතුරින්, උපයෝගී කරගත් ප්‍රමාණය වර්ෂය තුළ විනිමය නොවන ගනුදෙනු වලදී ක්‍රමානුකූල හා තාර්කික පදනමක් මත ආදායම් සහ වියදම් ලෙස සකස් කර ඇත. තවද, ප්‍රාග්ධන අග්‍රිමවල ඉතිරි මුදල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ජංගම වගකීමක් ලෙස සකස් කර ඇත.

3.11 ආදායම් හඳුනාගැනීම

- ලියාපදිංචි ගාස්තු
- සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ආදායම
- ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු
- පොත් ණය පොලී ආදායම

3.12 ආදායම් සහ වියදම්

සියලුම ආදායම් සහ වියදම් උපචිත පදනම (Accrual Basis) මත හඳුනා ගැනේ.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
2025 දෙසැම්බර් 31 වන දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

